# අටවිසි
# බුද්ධ වන්දනා
# තෙරුවන් වන්දනා
# සහ
# සෙත් පිරිත් දේශනා

සංස්කරණය

ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රමාධිපති මහා කම්මට්ඨානාචරිය
අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්වහන්සේ

# හඳුන්වාදීම

තුන් ලෝකවාසීනට අසහාය පිහිටක් වූ, මහත් ගුණ සමුදයකින් හා ඥාණ සම්පත්තියකින් යුක්ත වූ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් බබලන්නා වූ සම්මා සම්බුද්ධ රාජෝත්තමයාණන් වහන්සේලා අප ඉදිරියේ ජීවමානව වැඩ සිටිතැයි අරමුණු කරමින් ද්‍රෝණයක් පමණ සර්වඥ ධාතූන් වහන්සේ වැඩ සිටින ස්වර්ණමාලී මහ සෑ රදුන් අභියස සිට වන්දනා කරන්නට ලැබීම ද ඒ අවස්ථාව උදෙසා අටවිසි බුදුරජාණන් වහන්සේලා වන්දනා, තෙරුවන් වන්දනා සහ සෙත් පිරිත් දේශනා ඇතුලත් මෙම දහම් පොතත් සර්වඥ සම්බුද්ධ තෙසැත්තෑ ඥාණ සහ ධම්මපද ගාථා ඇතුලත් දහම් පොතත් මහා කම්මට්ඨානාචරිය අතිපූජනීය නා උයනේ අරියධම්ම මහා ස්වාමිපාදෝත්තමයාණන් වහන්සේගේ සංස්කරණයෙන් සැදැහැවතුන්ගේ දායකත්වයෙන් මුද්‍රණය කරවා ධර්ම දානය පිණිස පරිත්‍යාග කරවන්නට ලැබීම අප සැමදෙනා ලැබූ ඉමහත් භාග්‍යයකි. මෙම උත්තම අවස්ථාව මේ පිංකම හා සම්බන්ධවුනු අප සැම දෙනාගේ සසර ප්‍රාර්ථනාවක් විය යුතුය.

අනන්ත අප්‍රමාණ ගුණ ඇත්තා වූ ආර්ය මහා සංඝරත්නය හා පේලි වෙමින් වැඩසිටින්නා වූ අතිපූජනීය ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථා ප්‍රධාන අනුශාසක ධූරන්දර මහා කම්මට්ඨානාචරිය අතිපූජනීය නා උයනේ අරියධම්ම මහා ස්වාමිපාදෝත්තමයාණන් වහන්සේ, රුවන්මැලි මහ සෑ විහාරාධිපති පල්ලේගම හේමරතන ස්වාමීන්වහන්සේ ඇතුළු මහා සංඝරත්නයේ ආශිර්වාදයත්, අනුශාසනයත් දස දිසාවෙහි සිට මේ පිංකම හා සම්බන්ධ වෙමින් අසීමිත බුද්ධාලම්භන ප්‍රීතියෙන් යුතුව විවිධාකාරයෙන් පුණ්‍ය කටයුත්තෙහි හා සංවිධාන කටයුත්තෙහි යෙදෙන සියළුම සැදැහැවතුනුත් විවිධාකාරයෙන් මූල්‍ය පරිත්‍යාග කරමින් දයක වූ සැමදෙනාත්, නිරතුරුව පිහිට වන්නා වූ සම්මාදිට්ඨික දෙව් දේවතාවුන් වහන්සේලා සහ සාධු සිතින් සම්බන්ධ වූ පිංවතුන්ගේ ආශිර්වාදයත් මෙම අසිරිමත් අටවිසි බුදුරජාණන් වහන්සේලා වන්දනා පිංකම පැවැත්වීමේ පුණ්‍ය ජීවයයි. පුණ්‍ය ශක්තියයි.

තව අවුරුදු සිය දහසක් මුළුල්ලෙහි සම්බුදු ශාසනය ලොව පවතින තාක් දෙව් මිනිසුන්ගේ චිත්ත සන්තානයන් තුල  පහන් සිත් පුබුදුවාදමින් මේ පොළොව තලය මත වැඩ සිටිත්වා අරමුණු කරමින් සිදුකරනු ලබන බුද්ධ ප්‍රතිමා වහන්සේලා පූජාවද අටවිසි සම්මා සම්බුද්ධ රාජෝත්තමයාණන් වහන්සේලා උදෙසා සිදුකරනු ලබන අසිරිමත් ආලෝක පූජාවන් ඇතුළු බුද්ධ පූජාවන්ගෙන් ද, ප්‍රතිපත්ති පූජාවන්ගෙන්ද, ජනිතවන්නා වූ අසීමිත කුසල ශක්තිය ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රමාධිපති ප්‍රධාන අනුශාසක ධූරන්දර මහා කම්මට්ඨානාචරිය අතිපූජනීය නා උයනේ අරියධම්ම මහා ස්වාමිපාදෝත්තමයාණන් වහන්සේගේ දෙපාමුල උත්තම වූ ප්‍රතිපත්ති පූජාවක් වේවා. නිවන් මග පෙන්වා දෙන කල්‍යාණ මිත්‍ර ගුරු උතුමන් වහන්සේලා උදෙසා සිදුකරන්නා වූ උත්තම පූජාවක්ම වේවා !

මෙම පූජාවන්ගෙන් ජනිතවන්නා වූ කුසල සම්භාරය අතිපූජනීය නා උයනේ අරියධම්ම මහා ස්වාමිපාදෝත්තමයාණන් වහන්සේගේ පුණ්‍ය ජීවිතයහාම යාවනිබ්බාණ වේවා ! උන් වහන්සේට විංසත් ශත වර්ෂාධික කාලයක් නිදුක්ව නිරෝගීව සුවසේම පාරමීදම් පිරීම පිණිසම ඒකාන්තයෙන්ම හේතු වාසනා වේවා ! විසි අසංඛ්‍ය කල්ප ලක්‍ෂය තුල ලොව පහළ වූ 512000 අධික අසම සම සම්මා සම්බුදු රජාණන් වහන්සේලා හා පේලි වෙමින් මතු ලොව්තුරු බුදු බවම ලබත්වා !

මෙම අසිරිමත් පූජාව සඳහා නිරතුරුව ආශිර්වාද කරන්නා වූ පූජනීය දාස්වත්තේ සුමණසීල ස්වාමින් වහන්සේ, පූජනීය කහගොල්ලේ සෝමවංශ ස්වාමීන් වහන්සේ,  පූජනීය අගුල්ගමුවේ අරියනන්ද ස්වාමීන්වහන්සේ පූජනීය විහාරමැදවච්චියේ අරියවිමල ස්වාමීන් වහන්සේත් අපගේ ගෞරවනීය ආරාධනයෙන් සුවිශේෂ අටවිසි බුදු රජාණන්වහන්සේලා වන්දනා ගාථා පෙලක් නිබන්ධනය කල පූජනීය දිගන සුගතවංශ ස්වාමීන්වහන්සේත් මියන්මාරයේ සිට කිරිගරුඬ ප්‍රතිමා වහන්සේලා වැඩම කරවීම පිණිස කටයුතුකල පූජ්‍ය පානදුරේ අරණවිහාරි ස්වාමීන් වහන්සේ ඇතුළු විවිධාකාරයෙන් අනුශාසනාකලා වූ අතිපූජනීය මහා සංඝරත්නයත්,

ගිහි අනුශාසකත්වයෙන් කටයුතු කරන්නා වූ මහාචාර්ය නිමල් ද සිල්වා මහතා, චන්ද්‍ර ආරියරත්න මහත්මියත් මියන්මාරයේ සිට කිරිගරුඬ ප්‍රතිමා වහන්සේලා වැඩම කරවීම පිණිස සංවිධාන කටයුතුකල ඩී.එල්.ඩබ්ලිව්. ජයසිංහ මහතා සහ විවිධාකාරයෙන් අනුග්‍රහ දක්වන්නා වූ  නා උයන, පොල්ගස්ඕවිට, ගල්දූව, නාථගණේ ආරණ්‍ය සේනාසනය ඇතුළු ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාවට අනුබද්ධිත ආරණ්‍යය සේනාසනයන්හි දායක සභාවන්හි සියළුම දායක පින්වතුන් ද,

විවිධාකාරයෙන් අප සමග එක්ව සංවිධාන කටයුතු සහා දයකත්වයන් සිදුකරන්නා වූත් මෙම ධර්ම ග්‍රන්ථ පූජාව සඳහා දයකත්වයන් දැක් වූ සැම දෙනාත්, අකුරු සැකසූ සහ සෝදුපත් කියවීමෙහි යෙදුණු සැමදෙනාත්, විවිධාකාර පරිත්‍යාගයෙන් ඉමහත් ගරුත්වයෙන් කටයුතු සංවිධානය කල සියළුම දෙනාත්, අපගේ දෙමාපියන් වහන්සේලා පවුල්වල සාමාජිකයින් හිතමිත්‍රාදීන් ඇතුළු සැමදෙනාත්, ශ්‍රම දායකත්වයෙන් සහයෝගය දැක් වූ සැම දෙනාත් සාධු කියා සතුටු සිතින් මේ සියළු පුණ්‍ය ක්‍රියාවන් සඳහා ආශිර්වාද කළ සැමදෙනාගේත් සියළු සම්‍යක් ප්‍රර්ථනා ඉටු වී අමා මහ නිවනින් සැනසීම පිණිසම මෙම අසිරිමත් අටවිසි බුදු රජාණන් වහන්සේලා වන්දනාවෙන් සහ ධර්ම දානමය පූජාවෙන් ජනිතවන්නා වූ සියළු කුසල් සම්භාරය ඒකාන්තයෙන් හේතු වේවා !

මෙයට

අරියමග්ග සංවිධානය.
2009.06.27

## පොත ගැන වචනයක්

අටවිසි බුද්ධ පූජා වන්දනා ගාථා සහ සෙත් පිරිත් ඇතුලත් දහම් පොතක් සකස් වීම ඉතා ප්‍රයෝජනවත්ය. රුවන්මැලි මහා සෑයේදී පවත්වනු ලබන පිංකමේදී වන්දනා පූජාව සඳහා මෙය සකස් වී ඇත. සියලුම දෙනාට සරල බසින් කියවීමට සකසා ඇත. බුද්ධ පූජාවේ බුද්ධ වන්දනාවේ අනුසස් අසීමිතය. පියුමතුරා බුදුරජාණන් වහන්සේට මල් පූජාවක් කළ පිංවතෙකුට ගෞතම බුදු සසුන දක්වා අනුසස් ලැබී ඇත. ඒ පිංකමේ අනුහසින් සතර අපාදුකින් අතමිදී මනුස්ස සම්පත්තිය, දේව සම්පත්තිය, සක්‍ර සම්පත්තිය, සක්විති සම්පත්තිය, රාජ සම්පත්තිය ආදී සියලු සම්පත් උදපත් විය. නිර්වාන සම්පත්තියද ලබා ගැනීමට ගෞතම බුදු සසුනේදී හැකිවිය. එසේම පහන් පූජාව, ගිලන් පස පූජාව, කොඩි පූජාව, බුද්ධ වන්දනාව කිරීමේ චරිත කීපයක්ද සඳහන් වී ඇත. ඒ සැම දෙනාටම කල්ප ලක්ෂයක් අනුසස් ලැබී ඇත.

ඒ අනුව සලකා බලන කල්හි අප සැමට ද අනන්ත අපරිමාණ අනුසස් ලැබෙනු ඇත. රුවන්මැලි සෑ මළුවේ පවත්වන ලද පිංකම අංග සම්පූර්ණ පිංකමකි. කිරිගරුඬ අටවිසි බුද්ධ ප්‍රතිමා පූජාව, විදුලි ආලෝක පූජාව, හේවිසි පූජාව, අෂ්ඨපාන ගිලන්පස, කොඩි, කිරිආහාර පූජාව, අටපිරිකර මහා දනමය පිංකම් ආදී පිංකම් රාශියක් සිදුවේ. ඒ අතරට ධර්ම දනමය පිංකමක්ද සිදුවේ.

අරියමග්ග සංවිධානයේ මග පෙන්වීම නිසා මහා පිංකම් රාශියකට සහභාගි වීමට අපට වාසනාව ලැබිණි. අතිපූජ්‍ය නාඋයනේ අරිය ධම්ම මහා ස්වාමීන් වහන්සේගේ අනුසාසකත්වයෙන් මෙම පිංකම් මාලාව පැවැත්වේ. නැලියක් සර්වඥධාතූන් වහන්සේලා වැඩ සිටින ස්වර්ණමාලි මහා චෛතිය මළුවේ තුන්යම් රාත්‍රියක් ගත කිරීමට ලැබීමද ප්‍රසංසනීයයි. අතිවිශාල ජනකායක්ද, අතිවිශාල මහා සංඝරත්නයද සහභාගි වෙමින් පවත්වන ලබන පිංකම ඉතා මනෝහරය.

මේ පිංකමෙන් ජනිත කුසල් බලයෙන් අපවත් වී වදාළ අතිගරු රාජකීය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංශාභිධාන මා හිමිපාණන් වහන්සේට උතුම් බුදුබව අත්වේවා. අතිපූජ්‍ය මහා කම්මට්ඨානාචාර්ය නා උයනේ අරිය ධම්මාභිධාන මා හිමි පාණන් වහන්සේටද නිරෝගි සුව දිගාසිරි ලැබේවා. උතුම් බුදුබවම අත්වේවායි පතමි.

මහා පිංකමට සහයෝගය දැක්වූ සියලු මහා සඟ රුවණට නිරෝගි සුව දිගාසිරි ලැබේවා. නිවන් සුව අත්වේවා. මෙම දහම් පොත මුද්‍රණ වියදම් දැරූ සෑම දෙනාටද මිය ගිය සිය ඥාතීන්ටද පිංකමට දිවා රාත්‍රි වෙහෙසෙමින් කටයුතු කළ සැමටද ආධාර කල සැමටද දෙවියන් සහිත ලෝ වැසියන්ටද සෙත් ශාන්තිය සැලසේවා.

අරියමග්ග සංවිධානයේ සිය සාමාජික භවතුන්ට ආයුරා රෝග්‍යාදී සැප විහරන සැලසේවා. සාසනික කටයුතු කිරීමට ශක්තිය, බලය, ධෛර්‍යය, ඥාණය වැඩි දියුණු වේවායි ආශිර්වාද කරමි.

මෙයට,<br>
කාරුණික,<br>
කහගොල්ලේ සෝමවංශ හිමි,<br>
ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රමය,<br>
ගල්දූව-කහව.<br>
2009-06-10

මනුසසතතං ලිංග සමපතතී - හෙතු සතථාර දසසනං
පබබජජා ගුණ සමපතතී - අධිකාරොච ඡනදතා
අටඨ ධමම සමොධානා - අභිනීහාරො සමජකධතී

ලොවුතුරා බුදුන්වහන්සේ කෙනෙකුන් ඉදිරියේ ප්‍රථමකොට බුදුබවපැතීම අභිනීහාර නම් වේ. බුද්ධත්වය ලබන අභිනීහාරය අංග අටකින් යුක්ත වේ.

1. මනුස්සත්ත :
   ප්‍රථම අභිනීහාරය මිනිස් ජාතියේ සිටම සිදුකල යුතුය. අන් ජාතියක සිට කිරීමෙන් සිදුනොවේ.

2. ලිංග සම්පත්තිය :
   පිරිමි ආත්මභාවයක සිටම සිදුකල යුතුය. කාන්තාවක් (ස්ත්‍රියක්) කිසිකලෙක බුදු නොවේ.

3. හේතුව :
   එම ජාතියේම උත්සාහ කලහොත් රහත් වීමට තරම් උතුම් පිනක් තිබිය යුතුය.

4. සත්ථාර දස්සනං :
   ලොවුතුරා බුදුවරයන්වහන්සේ කෙනෙකගේ (දර්ශණය) හමුවීමය. ලොවුතුරා බුදුවරයකුගේ හමුවේදීම බුදුබව පැතිය යුතුය.

5. පබ්බජ්ජා (පැවිදිවීම) :
   බුදුබව පතන බෝධිසත්වයෝ බුදුසසුනෙහි හෝ පිළිගන්නා තාපස නිකායක පැවිදි විය යුතුය.

6. ගුණ සම්පත්තී :
   බෝධිසත්වයෝ ධ්‍යනාදී උතුම් ගුණ වල පිහිටා සිටිය යුතුය.

7. අධිකාරය :
   බුදු රජාණන් වහන්සේට ජිවිත පරිත්‍යාගයෙන් බුදුබව පැතිය යුතුය.

8. ඡන්දය :
   ලොවුතුරා බුද්ධත්වය පිළිබඳ මහත් ඕනෑකමක් බලවත් ඡන්දයක් (කැමැත්තක්) තිබිය යුතුය.

**උතුම් බුද්ධ භූමි සතර**

1. උත්සාහය : දස පාර මිතාදි ක්‍රියාවෙහි නෙපසුබස්නා වීර්‍යයෙන් ඉදිරියටම යන ස්වභාවය තිබිය යුතුය.

2. උම්මග්ග : පාරමී ධර්මයන් පිරීමේදී නොවරදින උපායන් දැන ගැනීමේ තියුණු ප්‍රඥව තිබිය යුතුය.

3. <u>අවත්ථාන</u> : පාරමීතා පිරීමේදී කෙතෙක් බාධා පැමිණියත් ප්‍රතිපත්තියෙහි නොසැලීසිමට ඉදිරියට යා යුතුය.

4. <u>හිත චරියාව</u> : තමනට වරද කරන්නාවූ සත්වයන් නොහැර සියලු සත්වයන් කෙරෙහිව කරුණාව මෛත්‍රිය පැවැත්විය යුතුය.

**මහා බෝධි සත්වයන්ගේ අදහස් හය**

1. <u>නෙක්ඛම්ම අදහස</u> : ගිහි ගෙයින් නික්මීමේ අදහස. ගිහි ගෙයි දොස් දැකීම. සියලු සැප සම්පත් හැරයාමේ අදහස.
2. <u>පවිවේක අදහස</u> : විවේක ගැනීමේ අදහස. විවේකයට කැමැත්ත ඇතිවීම.
3. <u>අලෝභ අදහස</u> : ලෝභයට ප්‍රතිපක්ෂ අදහසය. පංච මහා පරිත්‍යාග කිරීමේ අදහසය.
4. <u>අදේස අදහස</u> : ද්වේෂයට ප්‍රතිපක්ෂ අදහස. මෛත්‍රී අදහසය ද්වේෂයෙහි දොස් දකින්නේය.
5. <u>අමෝහ අදහස</u> : මෝහයට ප්‍රතිපක්ෂ අදහසය. මෝහයෙන් නොමුලාවන අදහසය. මෝහයේ දොස් දකින්නේය.
6. <u>නිස්සරණ අදහස</u> : සසර දුකෙන් මිදීමේ අදහසය සංසාරයේ දොස් දැක විදර්ශනා භාවනාවෙන් භවයෙන් මිදීමේ අදහසය.

**මහා බෝධිසත්වයන්ගේ සම්පත් සතර**

1. <u>ඉන්ද්‍රිය සම්පත්තිය</u> :

   සද්ධා ඉන්ද්‍රිය, විරිය ඉන්ද්‍රිය, සති ඉන්ද්‍රිය, සමාධි ඉන්ද්‍රිය, පඤ්ඤේන්ද්‍රිය යන ධර්මයන්ගේ දියුණු තියුණුබව මෙය වුවමනා තැනදී තැනට සුදුසු නුවණ අනුව ක්‍රියා කරයි.

2. <u>ප්‍රතිපත්ති සම්පත්තිය</u> :

   ආත්මාර්ථය නොබලාම පරාර්ථ සාධනයෙහි යෙදෙන බව දාන ශීලාදී කුසල ක්‍රියා කිරීමේදී සත්වයන් සසර දුකින් එතෙර කරවන මුදවන පිණිස සර්වඥ ඥාණයම ප්‍රාර්ථනා කරයි.

3. <u>කෞශල්‍ය සම්පත්තිය</u> :

   මහ බෝධිසත්වයන්ට තැනට සුදුසු නුවණ බවය කොතරම් දුෂ්කර දෙයක් වුනත් නොවරදිනා නුවණින් කටයුතු කරයි.

4. <u>අධ්‍යාශය සම්පත්තිය</u> :

බෝධිසත්වයන්ගේ පාරමී ධර්මයන් පිරීමේ බලවත් අදහස දීමෙහි අනුහස් ක්‍රියා අන්‍යයන්ද දීමෙහි යොදවති. මෙම කරුණු මහ බෝසතානන් වහන්සේ දැනගත් කරුණුය.

මෙවැනි අදහස් ලෝකයෙහිව පතුරුවන මහා බෝධිසත්වයන් වහන්සේලාට ලැබෙන ඉතා වටිනා ධර්මයෝය. මෙවැනි අදහස් ඇතිකරගෙන තමයි අපගේ ගෞතම බෝධිසත්වයන් වහන්සේ නියත විවරන ලබාගෙන උතුම් බුද්ධත්වය අවබෝධ කලේ එවැනි ගුණ සිහිපත් නරගෙන අද කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථා අනුශාසක ධුරන්ධර, ත්‍රිපිටකධරාචාර්ය, කර්මස්ථානාචාර්ය අති පූජනීය නා උයනේ අරියධම්ම ස්වාමින්වහන්සේගේ ජන්ම දිනය සිහිපත් කරමින් අනුරාධපුර ස්වර්ණමාලී මහා සෑරදුන් අභියස පවත්වන්නට යෙදෙන මෙම මහා පිංකම සදහා මෙවැනි උතුම් ධර්ම දනමය පිංකමක් වශයෙන් බෙදදෙන මෙම උතුම් කුසල් බලයෙන් අතිගරු පූජනීය අරියධම්ම ස්වාමින්වහන්සේට නිදුක් නීරෝගීව සුවසේම පාරමී පුරාගෙන ශාසනික ප්‍රතිපත්ති පුරාගෙන අති උතුම් ලොව්තුරා බුද්ධත්වය අවබෝධ පිණිස උපකාර වේවා. මෙම දහම් පොතට ආධාර කල සැමටත් අරියමග්ග සංවිධානයේ සැමටත් කටයුතු සංවිධානයෙන් උපකාර කළ සැමටත් සසර සුවසේම පාරමි පුරාගෙන අති උතුම් නිවන්සුව අවබෝධ වේවා !

මෙයට<br>
සසුන් ලැදි<br>
දාස්වත්තේ සුමනසීල හිමි<br>
විපස්සනා භාවනා මධ්‍යස්ථානය<br>
දික්හේන<br>
පොල්ගස්ඕවිට (011-2780140)

# පෙරවදන

සාරාසංඛෙය්‍ය කල්ප ලක්‍ෂය පුරා මෙතෙක් පහළ වූ සර්වඥයන් වහන්සේලා අටවිසිනම ගැන අර්ථකථා ග්‍රන්ථයන්හි අනුපිළිවෙළින් සඳහන් වී ඇත. බුද්ධවංශ පාලියෙහි දීපංකර සර්වඥයන් වහන්සේ සිට පස්විසි බුද්ධ ශාසන ගැන සවිස්තරව දේශනා කොට ඇත.

සියලු සර්වඥයන් වහන්සේලාගේ සමා ධර්මතා සමතිසකි, අසමාන කරුණු අටකි. එකම බුදුරජාණන් වහන්සේගේ ප්‍රතිසන්ධි මංගලය උත්පත්ති මංගලය බුද්ධත්ව මංගලය ධම්මචක්ක දේශනාව පරිනිර්වාණය අවස්ථාවන්හිදී පවා දශ දහසක් ලෝකධාතු කම්පාවෙති. එසේ කල්හි බුදුරජාණන් වහන්සේලා අටවිසි නමකගේ ගුණමහන්තාව මොනතරම් අසිරිමත් වේද,

ජිනපඤ්ජරය - අටවිසි පිරිත - අටවිසි ජ්වර පිරිත ආදී ආරක්‍ෂක පිරිතට අටවිසි බුද්ධ නාම ඉදිරිපත් කොට භාවිතා කිරීමෙන් බෞද්ධයෝ කොතරම් අනුසස් ලබත්ද, එම අටවිසි සම්බුදුරජාණන් වහන්සේලා උදෙසා බු.ව. 2553, ඇසළ පුර සැටවක තිථිය ලත් ඉරුදින (2009-06-27) අනුරාධපුර රුවන්මැලි මහ සෑ මළුවේදී සර්වරාත්‍රිකව පැවැත්වෙන අටවිසි බුද්ධ පූජාව පිණිස මෙම "අටවිසි සම්බුද්ධ වන්දනා" පොත සම්පාදනය වී ඇත.

අටවිසි බුදුරජාණන් වහන්සේලා වන්දනා, තෙරුවන් වන්දනා සහ සෙත් පිරිත් දේශනා මෙම දහම්පොත අරියමග්ග සංවිධානය මගින් අනුග්‍රාහක පරිත්‍යාගශීලීන්ගේ සහභාගිත්වයෙන් මුද්‍රණය කරවා පිරිනැමෙනුයේ ධර්මදාන ශීර්ෂයෙනි. මෙම ධර්ම ග්‍රන්ථය සම්පාදනයෙහිලා කටයුතුකල දාස්වත්තේ සුමනසීල ස්වාමීන් වහන්සේටත් අජ්විසි බුදුරජාණන් වහන්සේලා වන්දනාව පිණිස විසිතුරු ගාථා පෙළක් නිර්මාණය කළ දිගන සුගතවංශ ස්වාමීන් වහන්සේටත් අරියමග්ග සංවිධානයේ නිළධාරී මණ්ඩලයටත්, සාමාජික අනුග්‍රාහක සැමටත් අටවිසි බුදුරජාණන් වහන්සේලාගේ අනන්තාපරිමාණ බුද්ධ ගුණ - බුද්ධඥනානුභාව බලයෙන් ආයුරාරෝග්‍යාදී සැපතත් ධර්මඥනයත් භාවනාඥනයත් ශාන්ති ලක්‍ෂණ නිර්වාණ ධාතුවත් සුවසේම සාක්‍ෂාත් වේවා !

"සබෙබ සතතා භවනතු සුඛිතතතා"

මෙයට මෙතැති,
නා උයනේ අරියධම්ම ස්ථවිර,
නා උයන ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථා සේනාසනය,
පන්සියගම, මැල්සිරිපුර.

# පටුන


| | පිටුව |
|---|---|
| අටවිසි බුද්ධ පූජාව | 01 |
| තුනුරුවන් වඳනාව | 04 |
| චුද්දස බුද්ධ වන්දනාව | 07 |
| අටලොස් බුද්ධ ඤාණ වන්දනා | 08 |
| දඹදිව බුද්ධ වන්දනාව | 11 |
| මහා මංගල සූත්‍රය | 13 |
| රතන සූත්‍රය | 15 |
| කරණීය මෙත්ත සූත්‍රය | 21 |
| ආරක්ෂක පිරිත් දේශනා | 23 |
| ඤාතීන්ට දෙවියන්ට පින්දීම හා අනෙකුත් ගාථා | 24 |
| අටවිසි බුද්ධ වන්දනාව | 29 |
| අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්වහන්සේට වන්දනා ගාථා | 67 |
| අපගේ ඒකායන ප්‍රාර්ථනය | 69 |
| ධර්මදානය | 71 |

# අටවිසි බුද්ධ පූජාව

## 01 **ආරාධනාව**

යාවතා භගවා ලොකෙ - තිටෙඨය්‍ය තව සාසනං
තාවතා පතිගණ්භාතු - පූජාලොකානු කමපයා

ස්වාමීණි භාග්‍යවතුන් වහන්ස යම්තාක් දුරකට ඔබ වහන්සේගේ සාසනය ලොව පවතීයිද ඒතාක් ලෝකානුකම්පාවෙන් සියළු පූජාවන් පිළිගන්නා සේක්වා !

## 02 **පහන් පූජාව**

ගන්ධ තෙලපප දිතෙතන - දීපෙන තමධංසිනා
අටඨ වීසති මෙ බුදෙධ - පූජයාමී තමොනුදෙ

සුවඳ තෙලෙන් දැල්වූ අඳුර දුරලන්නා වූ මේ පහනින් තුන්ලොවට පහනක් වූ මෝහන්ධකාරය දුරලූ අටවිසි බුදුරජාණන් වහන්සේලා මේ පහනින් පූජා කරමි. පූජා වේවා !

## 03 **විදුලි බුබුළු පූජාව**

විජ්ජුලලතා පදිතෙතන - දීපෙන තමධංසිනා
අටඨ වීසති මෙ බුදෙධ - පූජයාමී තමොනුදෙ

අඳුර දුරලන්නාවූ විදුලි පහනින් තුන් ලොවට පහනක් වූ මෝහන්ධකාරය දුරලු අටවිසි බුදුරජාණන් වහන්සේලා විදුලි පහනින් පූජා කරමි. පූජා වේවා !

04 අටඨ වීසති මෙ බුදෙධ - දීපෙහි පූජයාමහං
තෙන ධමෙමන සංසාරෙ - චකඛු සුජකධතු සබබදා

අටවිසි බුදුරජාණන් වහන්සේලා මේ පහන් ආලෝකයෙන් පූජා කරමි. ඒ පහන් පූජාවේ කුසලානිසංසයෙන් සසරේදි ප්‍රඥා චක්‍ෂු සම්පත්තිය මනාකොට ලැබේවා !

05 වෙනෙය්‍ය හදයෙ මොහ - තමොකඛන්ධ විනොදකෙ
දීපෙනෙතෙහි පූජෙමි - පඤ්ඤ දීප ධරෙ ජිනෙ

වෙනෙය්‍ය ජනයාගේ හදවතෙහි අවිද්‍යා නැමැති අන්ධකාරය දුරුකලාවූ ද ප්‍රඥා නැමැති ආලෝකය දැරුවාවූද අටවිසි බුදුරජාණන් වහන්සේලා මේ පහන් ආලෝකයෙන් පූජා කරමි. පූජා වේවා !

06 ඉමිනා පුඤ්ඤ කමෙමන - පඤ්ඤවා සීලවා සදා
භවිත්වාහං ලභෙසීඝං - ධමම චකඛුං අනුතතරං

මේ සිදුකරගන්නා ලද පුණ්‍ය කර්මයෙන් මම සැම කල්හිම සිල්වන්තයෙක්වී ප්‍රඥාවන්තයෙක්වී අනුත්තර වූ ධර්ම චක්‍ෂුය ලබන්නෙමි. ලැබේවා !

07 **සුවඳ දුම් පූජාව**

අට්ඨ වීසති මෙ බුද්ධෙ - අනනත ගුණ ගන්ධිනෙ
සුගන්ධිනාහං ගන්ධෙන - හත්‍යාදරෙන පූජයෙ

අනන්ත ගුණ සුවඳින් සුවඳවත් වූ අටවිසි බුදුරජාණන් වහන්සේලා මම මේ සුවඳින් පූජා කරමි. පූජා වේවා !

08 **සුවඳ පැන් පූජාව**

සුගන්ධං සීතලං කපපං - පසනන මධුරං සුභං
අට්ඨ වීසති මෙ බුද්ධා - පතිගණ්හනතු මුතතම

අටවිසි බුදුරජාණන් වහන්සේලාට සුවඳවත් වූ සිසිල් වූ කැප වූ පහන් වූ මිහිරි වූ පිවිතුරු වූ උතුම් වූ මේ පැනින් මම පූජා කරමි. පූජා වේවා !

09 **අට්ඨපාන පූජාව**

අධිවාසෙතු නො භනෙත - අට්ඨ පානං පරිකපපිතං
අට්ඨවීසතිමෙ බුද්ධා - පතිගණ්හනතු මුතතම

අටවිසි බුදුරජාණන් වහන්සේලා අපගේ ආරාධනය ඉවසන සේක්වා. අප විසින් සකස්කරන ලද කැප සරුප් අෂ්ඨපාන ගිලන්පස අපවෙත අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා !

10 **චතුමධුර පූජාව**

අටඨ වීසති මෙ බුද්ධා - චතුමධුරං පරිකපපිතං
අනුකමපං උපාදාය - පතිගණ්හනතු මුතතම

අටවිසි බුදුරජාණන් වහන්සේලා අපගේ ආරාධනය ඉවසන සේක්වා ! අප විසින් සකස් කරන ලද කැප සරුප් චතු මදුර අප වෙත අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා !

11 **බෙහෙත් ඖෂධ පූජාව**

අටඨ වීසති මෙ බුද්ධා - භෙසජජං පරිකපපිතං
අනුකමපං උපාදාය - පතිගණ්හනතු මුතතම

අටවිසි බුදුරජාණන් වහන්සේලා අපගේ ආරාධනය ඉවසන සේක්වා. අප විසින් සකස් කරන ලද කැප සරුප් බෙහෙත් ඖෂධ අප වෙත අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා !

12 **දැහැත් පූජාව**

අටඨ වීසති මෙ බුද්ධා - තාම්බූලං පරිකපපිතං
අනුකමපං උපාදාය - පතිගණ්හනතු මුතතම

අටවිසි බුදුරජානන් වහන්සේලා බුලත් සුණු පුවක් වලින් යුක්තවූ මෙම බුලත් අපවෙත අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා !

13 **කොඩි පූජාව**

අටඨ වීසති මෙ බුද්ධා - ධමමද්ධජ ධරෙ ජිනෙ
ධජෙනෙතෙහි පූජෙමි - ධමම රාජෙ ධජූපමෙ

ධර්ම නැමැති ධජය දරන්නාවූ මහ යසස් නැමැති ධජයන්ගෙන් නැගී ගියාවූ ධීරවූ ධජයක් බඳු වූ ධර්මරාජයාණන් වහන්සේලාට උසස් වූ කොඩිවලින් පූජා කරමි. පූජා වේවා !

# තුනුරුවන් වන්දනාව

ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො
විජ්ජා චරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො
පුරිසදම්ම සාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස" ඔබවහන්සේ සියලු පූජාවන්ට සුදුසු වූ සේක, චතුරාර්ය්‍ය සත්‍ය තමන්ම අවබෝධ කළ සේක, ත්‍රිවිද්‍යාව පසළොස්චරණ ධර්මයන්ගෙන්ද, සියලු ලෝක ධාතුව දැන වදාල සේක, උත්තරීතර ගුණයෙන් සත්වයා දමනය කළ සේක, චතුරාර්ය්‍ය සත්‍ය අවබෝධ කොට අන්‍යන්ට අවබෝධ කළ සේක, සියලු පුණ්‍ය භාග්‍යන්ගෙන් යුක්ත වන හෙයින් භගවා නම් වන සේක.

"බුද්ධං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි"
බුද්ධ රත්නය දිවිහිමියෙන් සරණ යමි.

යෙච බුද්ධා අතීතා ච - යෙච බුද්ධා අනාගතා
පච්චුප්පන්නා ච යෙ බුද්ධා - අහං වන්දාමි සබ්බදා

අතීත බුද්ධ රත්නයටද, අනාගත බුද්ධ රත්නයටද, වර්තමාන බුද්ධ රත්නයටද මම සැම කල්හි නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

නත්ථි මෙ සරණං අඤ්ඤං - බුද්ධො මෙ සරණං වරං
එතෙන සච්ච වජ්ජෙන - හොතු මෙ ජයමඞ්ගලං

බුද්ධ රත්නය හැර මට අන් සරණක් නැත්තේය. බුද්ධ රත්නය මගේ උත්තම රත්නය වන්නේය. මේ සත්‍යානුභාවයෙන් මා හට ජය මංගල්‍යයක් වේවා !

උත්තමඞ්ගෙන වන්දෙහං - පාදපංසු වරුත්තමං
බුද්ධෙ යො ඛලිතො දොසො - බුද්ධො ඛමතු තං මමං

භාග්‍යවතුන් වහන්සේගේ සිරිපා පහස ලද දූවිල්ලද මම හිස මුදුනින් නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා ! බුද්ධ රත්නය කෙරෙහි මා අතින් සිදුවූ වරදට භාග්‍යවතුන් වහන්සේ ක්ෂමා වන සේක්වා !

සාධු ! සාධු !! සාධු !!!

සවාකඛාතො, භගවතා ධමෙමා සන්දිට්ඨිකො, අකාලිකො,
එහිපසසිකො, ඔපනයිකො, පච්චතතං වෙදිතබෙබා විඤඤුහීති

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස" ඔබ වහන්සේගේ ශ්‍රී සද්ධර්ම රත්නය මුල, මැද, අග යහපත් වන සේක, මෙලොව ජීවිතයේදීම පලවිපාක ලබාදෙන සේක, කල් නොයවා ඵල විපාක ගෙන දෙන සේක, මෙහි එව බලවැයි කියහැකි ගුණ ඇති සේක, මගඵල ධර්මය සිතෙහි පහල කරගත යුතු වන සේක, නුවනැත්තන් විසින් අවබෝධ කළ යුතු වන සේක, යන අර්ථයයි.

ධමමං ජීවිතං පරියනතං සරණං ගචඡාමි

ධර්ම රත්නය දිවිහිමියෙන් සරණ යමි.

යෙච ධමමා අතීතා ච - යෙච ධමමා අනාගතා
පච්චුප්පනනා ච යෙ ධමමා - අහං වන්දාමි සබබදා

අතීත වූ ධර්ම රත්නයටද, අනාගත වූ ධර්ම රත්නයටද, වර්තමාන ධර්ම රත්නයටද, මම සැම කල්හි නමස්කාර කරමි මාගේ නමස්කාරය වේවා !

නත්ථි මෙ සරණං අඤඤං - ධමෙමා මෙ සරණං වරං
එතෙන සච්ච වජ්ජෙන - හොතු මෙ ජයමඞගලං

ධර්ම රත්නය හැර මට අන් සරණක් නැත්තේය. ධර්ම රත්නය මාගේ උතුම් සරණය වන්නේය. මේ සත්‍යානුභාවයෙන් මා හට ජය මංගලයක් වේවා !

උතතමං ගෙන වනෙදහං - ධමමඤච තිවිධං වරං
ධමෙම යො ඛලිතො දොසො - ධමෙමා ඛමතු තං මමං

ලොවිතුරු, මගඵල, නිවන්, ත්‍රිවිධ වූ, ධර්ම රත්නයට දොහොත් මුදුන් දී මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා. ධර්ම රත්නය කෙරෙහි සිදුවූ පමා වරදට ධර්මරත්නය මට සමාවන සේක්වා !

සාධු ! සාධු !! සාධු !!!

සුපටිපන්නො භගවතො සාවක සංඝො
උජුපටිපන්නො භගවතො සාවක සංඝො
ඤායපටිපන්නො භගවතො සාවක සංඝො
සාමීචිපටිපන්නො භගවතො සාවක සංඝො
යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨපුරිස පුග්ගලා
එස භගවතො සාවක සංඝො
ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො
අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස" ඔබ වහන්සේගේ ශ්‍රාවක මහා සංඝරත්නය මනාව පිළිපන් සේක, ඍජු මාර්ගයට පිළිපන් සේක, නිවන් මගට පිළිපන් සේක, ගෞරව කළ යුතු මාර්ගයට පිළිපන් සේක, යොදුන් සිය දහස් ගණනකින් වුවත් පැමිණ සිව්පස පිළිගැන්වීමට සුදුසු සේක, ආගන්තුක සත්කාරයන්ට සුදුසු වූ සේක, මෙලොව පරලොව පින්ඵල අදහා දෙන දානයට සුදුසු වූ සේක, දොහොත් මුදුන් දී වැඳ නමස්කාර කිරීමට සුදුසු වූ සේක, සියලු ලෝක වාසීන්ට කුසල් වැපිරීමට පින්ඵල නෙලාගැනීමට පිංකෙත වූ සේක යන අර්ථයයි.

සංඝං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි
සංඝ රත්නය දිවිහිමියෙන් සරණ යමි.

යෙච සංඝා අතීතා ච - යෙච සංඝා අනාගතා
පච්චුප්පන්නා ච යෙ සංඝා - අහං වන්දාමි සබ්බදා

අතීත සංඝ රත්නයටද, අනාගත සංඝ රත්නයටද, වර්තමාන සංඝ රත්නයටද මම සැම කල්හි නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

නත්ථි මෙ සරණං අඤ්ඤං - සංඝො මෙ සරණං වරං
එතෙන සච්ච වජ්ජෙන - හොතු මෙ ජයමඞ්ගලං

සංඝරත්නය හැර මා හට අන් සරණක් නැත්තේය. සංඝරත්නය මාගේ උතුම් සරණය වන්නේය. මේ සත්‍යානුභාවයෙන් මා හට ජය මංගල්‍යයක් වේවා !

උත්තමඞ්ගෙන වන්දෙහං - සංඝං ච තිවිධොත්තමං
සංඝෙ යො ඛලිතො දොසො - සංඝො ඛමතු තං මමං

සම්මුති, සේක අසේක යන ත්‍රිවිධ වූ උත්තම සංඝරත්නයට මම උත්තමංගනයෙන් නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා ! මහා සංඝ රත්නය කෙරෙහි මාගෙන් සිදුවූ පමා වරදට මහා සංඝරත්නය මට ක්ෂමාවන සේක්වා !

සාධු ! සාධු !! සාධු !!!

## චුද්දස බුද්ධ වන්දනාව

01. දුකෙඛ ඤාණං බුදධ ඤාණං
දුක්ඛ සත්‍යයෙහි පැවැති ඤාණය බුද්ධ ඤාණයයි.

02. දුකඛ සමුදයෙ ඤාණං බුදධ ඤාණං
දුක්ඛ සමුදය සත්‍යයෙහි පැවැති ඤාණය බුද්ධ ඤාණයයි.

03. දුකඛ නිරොධෙ ඤාණං බුදධ ඤාණං
දුක්ඛ නිරෝධ සත්‍යයෙහි පැවැති ඤාණය බුද්ධ ඤාණයයි.

04. දුකඛ නිරොධෙ ගාමිණී පටිපදාය ඤාණං බුදධ ඤාණං
දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාවෙහි පැවැති ඤාණය බුද්ධ ඤාණයයි.

05. අතථ පටිසමභිදෙ ඤාණං බුදධ ඤාණං
අත්ථ පටිසම්පදාවෙහි පැවැති ඤාණය බුද්ධ ඤාණයයි.

06. ධමම පටිසමභිදෙ ඤාණං බුදධ ඤාණං
ධම්ම පටිසම්භිදාවෙහි පැවැති ඤාණය බුද්ධ ඤාණයයි.

07. නිරුතති පටිසමභිදෙ ඤාණං බුදධ ඤාණං
නිරුත්ති පටිසම්භිදාවෙහි පැවැති ඤාණය බුද්ධ ඤාණයයි.

08. පටිභාණ පටිසමභිදෙ ඤාණං බුදධ ඤාණං
පටිභාන පටිසම්භිදාවෙහි පැවැති ඤාණය බුද්ධ ඤාණයයි.

09. ඉන්ද්‍රිය පරොපරියතෙත ඤාණං බුදධ ඤාණං
ඉන්ද්‍රිය ධර්මයන්ගේ උස් පහත් බව දන්නා ඤාණය බුද්ධ ඤාණයයි.

10. සතතානං ආසයානුසයෙ ඤාණං බුදධ ඤාණං
සත්වයන්ගේ ආසය අනුශය දන්නා ඤාණය බුද්ධ ඤාණයයි.

11. යමක පාටිහාරියෙ ඤාණං බුද්ධ ඤාණං
යමාමහ පෙලහැර දැක්වීමේ ඤාණය බුද්ධ ඤාණයයි.

12. මහා කරුණා සමාපත්තියා ඤාණං බුද්ධ ඤාණං
සත්වයන්ට මහා කරුණාව දැක්වීමේ ඤාණය බුද්ධ ඤාණයයි.

13. සබ්බඤ්ඤුත ඤාණං බුද්ධ ඤාණං
සියල්ල අවබෝධ කළ ඤාණය බුද්ධ ඤාණයයි

14. අනාවරණ ඤාණං බුද්ධ ඤාණං
අනාවරණයේ පැවති ඤාණය බුද්ධ ඤාණයයි

ඉමානි චුද්දස බුද්ධ ඤාණානි ඉමෙසං අට්ඨ ඤාණානි
සාවක සාධාරණානි ඡ ඤාණානි අසාධාරනානි සාවකෙහි
ඉමෙහි චුද්දස බුද්ධ ඤාණෙහි සමන්නාගතං
සම්මා සම්බුද්ධං භගවන්තං සිරසා නමාමි

මේ දාහතරක් ඤාණයෝ බුද්ධ ඤාණයෝ වෙති. මෙයින් අටක් (8) ශ්‍රාවකයින්ට සාධාරණය. මෙයින් හයක් (6) ශ්‍රාවකයින්ට අසාධාරණය. මේ ඤාණ දාහතරෙන් සමන්නාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේට මාගේ සිරසින් නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## අටළොස් බුද්ධ ඤාණ වන්දනා

අතීතංසෙ බුද්ධස්ස භගවතො අප්පටිහතං ඤාණං
අනාගතංසෙ බුද්ධස්ස භගවතො අප්පටිහතං ඤාණං
පච්චුප්පන්නංසෙ බුද්ධස්ස භගවතො අප්පටිහතං ඤාණං

භාග්‍යවතුන් වහන්සේගේ ඤාණය අතීත කොටසෙහිද නොපැකිලව පවතින්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ඤාණය අනාගත කොටසෙහිද නොපැකිලව පවතින්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ඤාණය වර්තමාන කොටසෙහිද නොපැකිලව පවතින්නේය.

ඉමෙහි තීහි ධම්මෙහි සමන්නාගතස්ස බුද්ධස්ස භගවතො
සබ්බං කාය කම්මං ඤාණ පුබ්බංගමං ඤාණානු පරිවත්තං
සබ්බං වචී කම්මං ඤාණ පුබ්බංගමං ඤාණානු පරිවත්තං
සබ්බං මනො කම්මං ඤාණ පුබ්බංගමං ඤාණානු පරිවත්තං

මේ ධර්ම තුනෙන් සමන්නාගතවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ කාය කර්මය නුවණ පෙරදැරිකොට ඇත්තේය. නුවණ අනුව පවතින්නේය. වාක් කර්මයද නුවණ පෙරදැරි කොට ඇත්තේය. නුවණ අනුව පවතින්නේය. මනෝ කර්මයද නුවණ පෙරදැරි කොට ඇත්තේය. නුවණ අනුව පවතින්නේය.

ඉමෙහි ඡහි ධම්මෙහි සමන්නාගතස්ස බුද්ධස්ස භගවතො
නත්ථි ඡන්දස්ස හානි නත්ථි ධම්ම දෙසනාය හානි
නත්ථි විරියස්ස හානි නත්ථි සමාධිස්ස හානි
නත්ථි පඤ්ඤාය හානි නත්ථි විමුත්තියා හානි

මේ ධර්ම හයෙන් සමන්නාගතවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ලෝවැඩ කිරීමෙහි වූ ඡන්දයෙහි පිරිහීමක් නැත්තේය. ධර්ම දේශනාවේ පිරිහීමක් නැත්තේය, විරියේ පිරිහීමක් නැත්තේය. ප්‍රඥාවෙහි පිරිහීමක් නැත්තේය. අර්හත් ඵල විමුක්තියෙහි පිරිහීමක් නැත්තේය.

ඉමෙහි ද්වාදසහි ධම්මෙහි සමන්නාගතස්ස
බුද්ධස්ස භගවතො නත්ථි දවා නත්ථි රවා නත්ථි
අප්ඵුටං නත්ථි වෙගායිතත්තං නත්ථි අබ්‍යාවට
මනො නත්ථි අප්පටි සංඛානු පෙක්ඛා

මේ ධර්ම දොළොසින් සමන්නාගතවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ නුවණින් තොර වූ වාචසික ක්‍රීඩා විකාරයක් නැත්තේය. නුවණින් තොරවූ යුහුසුලු ක්‍රියාද නැත්තේය. නුවණින් ස්පර්ශ නොකළ ක්‍රියාවක්ද නැත්තේය. සිහියෙන් තොරව කරනු ලබන වේගවත් ක්‍රියා නැත්තේය. නිරාර්ථක චිත්ත සමුදචාර නැත්තේය. අඥාන උපේක්ෂා නැත්තේය.

ඉමෙහි අට්ඨාරසහි ධම්මෙහි සමන්නාගතං
සම්මා සම්බුද්ධං භගවන්තං සිරසා නමාමි

මේ අටලොස් ධර්මයන්ගෙන් සමන්නාගතවූ භාග්‍යවත් වූ බුදු රජාණන් වහන්සේට මම දෙහොත් මුදුන් දී නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## බෝධි වන්දනාව

යසසමූලෙ නිසිනෙනාව - සබබාරිවිජයං අකා
පතෙතා සබබඤ්ඤුතං සතථා - වනෙද තං බොධිපාදපං

යම් බෝධි මූලයක වැඩහුන්නාවූ ජිනේන්ද්‍රයන් වහන්සේ කෙලෙස් සතුරන් නසා ජයලැබූ සේක්ද, ශාස්තෲන් වහන්සේ සර්වඥබවට පත් වූයේ යම් බෝධි මූලයක සිටද ඒ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

ඉමෙ එතෙ මහා බොධි-ලොක නාථෙන පූජිතා
අහංපි තෙ නමසසාමි-බොධිරාජා නමත්‍ථු තෙ

මේ බොධීන් වහන්සේ ලෝකනාථයන් වහන්සේ විසින්ද පූජාලත් සේක. මමද ඒ මේ බෝධිරාජයාණන් වහන්සේට නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

පඨමං බොධිපලලංකං - දුතියං ච අනිමමිසං
තතියං චංකමණං සෙටඨං- චතුත්‍ථං රතනාඝරං
පඤචමං අජපාලං ච - මුචලිනෙදන ඡටඨමං
සතතමං රාජායතනං - වනෙද තං මුනිසෙවිතං

පලමුව බෝ රුක මුලද, (වජිරාසනයේද) දෙවනුව අනිමිස සෑයද, තෙවනුව රුවන් සක්මනද, සිව්වැනිව රුවන් ගෙයද, පස්වැනිව අජපල් රුකමුලද, සයවැනිව මුචලින්ද සෑයද, සත්වෙනිව රාජායතනද යන මුනීන්ද්‍රයන් වහන්සේ සේවනය කළ ඒ සත්සති සෑයන්ට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

මහා කරුණා රස මතිමණ්ඩිතසස අනනත ඤාණසස
අසාධරණ පඤඤාසස දස පාරමිතා බල සමුදිතසස
දසබල සමනනාගතසස අපරිමෙය්‍ය ගුණ සාගරසස
අමහාකං සත්‍ථුනො සරස රංසිජාල පරිකිණණං
සමමා සමබුදධ පූජිතං සිරි බොධි රාජං සිරසා නමාමි

මහා කරුණා රස ප්‍රතිමණ්ඩිතවූ අනන්ත ඥාණ ඇත්තාවූ, අසාධාරණ ප්‍රඥා ඇත්තාවූ, දසපාරමී බලයෙන් පහලවූ, දසබල ඥාණයෙන් සමන්විත වූ, අපරිමාන ගුණ සාගරවූ, අප ශාස්තෲන් වහන්සේගේ සවනක් ගණ රැස් දහරින් ගැවසී ගත්තාවූ, සම්බුද්ධ පූජිතවූ, ජය ශ්‍රී මහා බෝධි රාජයන් වහන්සේට දෙහොත් මුදුන් දී මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !



## දඹදිව ශ්‍රී මහා බෝධිය වැඳීම

යස්මිං නිසජ්ජ වජිරාසන බන්ධනේන
ජේත්වා සවාසන කිලේස බලං මුනින්දෝ
සම්බෝධි ඤාණ මච ගම්ම විහාසි සම්මා
තං බෝධි චේතියමහං සිරසා නමාමි

මුනීන්ද්‍රයන් වහන්සේ යම් තැනක හිඳ වජිරාසනය බැඳීමෙන් වැඩහිඳ වාසනා සහිත කෙලෙස් බලමුලුව ජයගෙන සර්වඥතා ඥාණය ප්‍රත්‍යක්ෂ වශයෙන් මැනවින් අත්පත් කොට ගෙන වාසය කලසේක්ද ඒ පූජනීය ස්ථානයත් එහි කරවන ලද චෛත්‍යයත් ශීර්ෂ ප්‍රණාමයෙන් මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

## දඹදිව දම්සක් චෛත්‍යය වැඳීම

සංකම්පයං දසසහස්සිය ලෝක ධාතුං
දෙසේසි යත්‍ර භගවා වර ධම්ම චක්කං
බාරාණසීපුර සමීප වනේමිගානං
තං ධම්ම චේතිය මහං සිරසා නමාමි

භාග්‍යවතුන් වහන්සේ යම් තැනක වැඩහිඳ ගෙන දස දහසක් ලෝකධාතූන් කම්පා කරවමින් උතුම් වූ ධර්ම චක්‍රය දෙසූ සේක්ද බරණැස් නුවර සමීපයෙහි මුව වනයෙහි වූ ඒ පූජ්‍ය ස්ථානයද එහි කරවන ලද චෛත්‍යයද ශීර්ෂ ප්‍රණාමයෙන් මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

## දඹදිව පරිනිර්වාණ චෛත්‍යය වැඳීම

කත්වාන ලෝක හිතමත්තන හිතඤ්ච නාථෝ
ආසීතිකෝච උපවත්තන කානනම්හි
යස්මිං නිපජ්ජ ගතවා නිරුපාධි සේසං
නිබ්බාන චේතියමහං සිරසා නමාමි

ඒ ලෝකනාථ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ තම වැඩ සහ සකල ලෝකවාසීන්ගේ වැඩද කොට සියලු බුදු කිස නිමවා උපතින් අසූ අවුරුදු ඇතිව උපවත්තන නම් සල් වනයෙහි යම් තැනක වැඩ හිඳ නිරුපාධිශේෂ පරිනිර්වාණ ධාතුවට පත්වූ සේක්ද ඒ ස්ථානයද එහි බැඳි චෛත්‍යයද ශීර්ෂ ප්‍රණාමයෙන් මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

# මහා මංගල සූත්‍රය

ඒවං මෙ සුතං ඒකං සමයං භගවා
සාවත්ථියං විහරති ජෙතවනෙ
අනාථ පිණ්ඩිකසස ආරාමෙ
අථ බො අඤ්ඤතරා දෙවතා
අභිකකනතාය රතතියා
අභිකකනත වණ්ණා කෙවල කපපං
ජෙතවනං ඕභාසෙත්වා යෙන භගවා
තෙනුප සංකම් උපසංකමිත්වා
භගවනතං අභිවාදෙත්වා
ඒකමනතං අටඨාසි ඒකමනතං ඨිතා
ඛොසා දෙවතා භගවනතං ගාථාය අජකධභාසි

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬු සිටුහු ගේ ආරාමයේ වැඩ වසන සේක.

එකල්හි නාම ගෝත්‍රයෙන් අප්‍රසිද්ධ වූ එක්තරා දිව්‍ය පුත්‍රයෙක් ප්‍රථම යාමය ඉක්ම වූ කල්හි යහපත් ශරිර වර්ණය ඇතිව සියලු ජේතවනය බබුළුවා ගෙන යම් තැනෙක්හි බුදුරජාණන් වහන්සේ වසන සේක්ද එතැනට එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේය. එකත් පස්ව සිටියා වූ ඒ දිව්‍ය පුත්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථාවකින් මෙසේ සැලකර සිටියේය.

01 බහූ දෙවා මනුසසාච - මංගලානි අචිනතයුං
ආකංඛමානා සොත්ථානං - බ්‍රෑහි මංගල මුතතමං

දෙලොවට යහපත කැමති දෙවියෝ ද, මනුෂ්‍යයෝ ද, මංගල සම්මත කරුණු මොනවාදැයි සිතුහ. ඒ දෙව් මිනිසුන්ට අනුකම්පාවෙන් හිත සුව එළවන මංගලයන් දේශනා කළ මැනවි.

02 අසෙවනා ච බාලානං - පණ්ඩිතානංච සෙවනා
පූජාච පූජනීයානං - ඒතං මංගල මුතතමං

අනුවණ බාලයන් සේවනය නොකිරීම ද, පණ්ඩිතයන් සේවනය කිරීම ද, බුද්ධාදි පිදිය යුත්තන් පිදීම ද, දෙලොව දියුණුව ගෙන දෙන කරුණු ය.

03 පතිරූප දෙස වාසොච-පුබ්බෙච කතපුඤ්ඤතා
අත්තසම්මා පණීධිච-එතං මංගල මුත්තමං

සුදුසු පෙදෙසක විසීමද, පෙර කල පින් ඇති බවද, සිත මනාව පිහිටුවීමද, උතුම් මංගල කරුණු ය.

04 බාහු සච්චඤ්ච සිප්පඤ්ච -විනයොච සුසික්ඛිතො
සුභාසිතාච යා වාචා-එතං මංගල මුත්තමං

බොහෝ ඇසූ පිරූතැන් ඇති බවද, ශිල්ප දැනීමද, මනා හික්මීම ද, සුබස් බිණුම ද, මංගල කරුණු ය.

05 මාතා පිතූ උපට්ඨානං- පුත්ත දාරස්ස සඞ්ගහො
අනාකුලාච කම්මන්තා - එතං මංගල මුත්තමං

මවුපියනට උවටැන් කිරීමද, අඹුදරුවනට සංග්‍රහ කිරීම ද, නිරවුල් කර්මාන්තය ද යන මේ කාරණා උතුම් මගුල් ය.

06 දානංච ධම්ම චරියාච-ඤාතකානංච සඞ්ගහො
අනවජ්ජානි කම්මානි-එතං මංගල මුත්තමං

දන් දීම ද, දස කුසල්හි හැසිරීමද, නෑයනට සංග්‍රහ කිරීමද, නිවැරදි කර්මාන්තයද යන මේ කාරණා උතුම් මගුල් ය.

07 ආරති විරති පාපා-මජ්ජපානාච සඤ්ඤමො
අප්පමාදෙච ධම්මෙසු-එතං මංගල මුත්තමං

පාපයෙහි නොඇල්මද, අකුසලයෙන් වෙන්වීම ද, මත් පැනින් වැළකීම ද, හැම කුසල් දහම් හි පමා නොවීම ද උතුම් මගුල් ය.

08 ගාරවොච නිවාතොච-සන්තුට්ඨීච කතඤ්ඤුතා
කාලෙන ධම්ම සවණං-එතං මංගල මුත්තමං

ගරු කළ යුත්තනට ගරු කිරීම ද, යටහත් පහත් බව ද, ලද දෙයින් සතුටුවීමද, කළගුණ සැලකීමද, උතුම් මගුල් ය.

09 ඛනතීච සොච චසසතා - සමණානංච දසසනං
කාලෙන ධමම සාකචඡා - එතං මංගල මුතතමං

ඉවසීම ද, කීකරු බවද, ශ්‍රමණයන් දැකීම ද, සුදුසු කල ධර්ම සාකච්ඡාවද උතුම් මගුල් ය.

10 තපොච බ්‍රහමචරියංච - අරිය සචචාන දසසනං
නිබබාන සචජි කිරියාච - එතං මංගල මුතතමං

තපසද, උතුම් හැසිරීමද, සිවුසස් දැකීමද, නිවන් අවබෝධ කරගැනීම ද උතුම් මගුල් ය.

11 ඵුටඨසස ලොක ධමෙමහි - චිතතං යසස න කමපති
අසොකං විරජං ඛෙමං - එතං මංගල මුතතමං

අටලෝ දහමින් සිත කම්පා නොවේද, ශෝක රහිත ද, රාගාදි කෙලෙස් දූලි නැත් ද, බිය රහිත ද මේ උතුම් මගුල් ය.

12 එතාදිසානි කතවාන - සබබතථ මපරාජිතා
සබබතථ සොතථිං ගචඡනති - තං තෙසං මංගල මුතතමනති

මේ බඳු මංගලයන් කොට සියලු තන්හි නොපැරදුනාහු සියලූ තැන සැපතට යෙති. ඔවුන්ට මේ කරුණු තිස් අට උතුම් මගුල් වේ. දෙලොව වැඩ සදලන කරුණු වේ.

## රතන සූත්‍රය

01 යානීධ භූතානී සමාගතානී
භුමමානි වා යානිව අනතලිකෙඛ
සබෙබව භුතා සුමනා භවනතු
අථොපි සකකචච සුණනතු භාසිතං

භූමියෙහි උපන්නා වු හෝ අහසෙහි උපන්නා වු හෝ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙහි රැස් වුවාහු වෙත්ද, ඒ සියලු භූතයෝ සතුටු සිත් ඇත්තාහු වෙත්වා ! තවද මාගේ වචනය මනා කොට අසත්වා !

02 තසමා හි භූතා නිසාමෙථ සබ්බෙ
මෙතතං කරොථ මානුසියා පජාය
දිවාච රතෙතා ච හරනති යෙ බලිං
තසමා හි නෙ රකඛථ අපපමතතා

අමනුෂ්‍යයිනි "යම් කරුණක් සඳහා මෙහි රැස්වූවාහු ද එහෙයින් සියල්ලෝම මාගේ ධර්‍මය අසවු. මනුෂ්‍ය ප්‍රජාව කෙරෙහි මෛත්‍රිය කරවු. මනුෂ්‍ය කෙනෙක් රෑ දවල්හි තොපට පූජා ගෙනෙත්ද එහෙයින් ඔවුන් රකිවු.

03 යං කිඤචි විතතං ඉධ වා හුරං වා
සගෙගසු වා යං රතනං පණීතං
න නො සමං අත්‍ථි තථාගතෙන
ඉදම්පි බුදෙධ රතනං පණීතං
එතෙන සචෙචන සුවත්‍ථි හොතු

මේ මනුෂ්‍ය ලෝකයෙහි හෝ වෙනත් අවශේෂ ලෝකයක හෝ යම් ධනයක් වේ ද ? ඒ කිසි තැනෙක තථාගතයන් හා සමාන වූ ධනයක් හෝ රත්නයක් හෝ නැත්මය. බුදුරදුන් කෙරෙහි මෙය ශ්‍රේෂ්ඨ වූ රත්නයකි. ඒ සත්‍ය බලයෙන් සත්‍වයනට සෙත් වේවා !

04 ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතො
න තෙන ධමෙමන සමත්‍ථි කිඤචි
ඉදම්පි ධමෙම රතනං පණීතං
එතෙන සචෙචන සුවත්‍ථි හොතු

ආයර්‍යමාර්‍ග සමාධියෙහි සුපිහිටි සිත් ඇති ශාක්‍ය කුලයෙහි උපන් මුනි තෙමේ රාගාදීන් ක්‍ෂය වන්නා වූ රාගාදියෙන් වෙන් වූ ප්‍රණීත වූ යම් නිවනක් නුවණින් අවබෝධ කළේ ද ඒ නිර්‍වාණ ධර්‍මය හා සමාන වූ කිසි රත්නයක් නැත. මෙයද ධර්‍මයෙහි පවත්නා ශ්‍රේෂ්ඨ වූ රත්න භාවයකි. ඒ සත්‍ය බලයෙන් සත්‍වයනට සෙත් වේවා !

05 යම්බුදධ සෙට්ඨො පරිණණායි සුචිං
සමාධිමානනතරිකඤඤමාහු
සමාධිනාතෙන සමො න විජ්ජති
ඉදම්පි ධමෙම රතනං පණීතං
එතෙන සචෙචන සුවත්‍ථි හොතු

බුද්ධ ශ්‍රේෂ්ඨ තෙමේ ඉතා පිරිසිදු යමක් ප්‍රශංසා කොට දේශනා කළ සේක්ද ? එය ආනන්තරික සමාධියයි. ඒ සමාන වූ අන්කිසි සමාධියක් නැත. මෙයද ධර්මයෙහි ශ්‍රේෂ්ඨ භාවයකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා !

06 යෙ පුග්ගලා අට්ඨ සතං පසත්ථා
චත්තාරි එතානි යුගානි හොන්ති
තෙ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
එතෙසු දින්නානි මහප්ඵලානි
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

බුද්ධාදී සත් පුරුෂයන් විසින් පසසන්නා ලද යම් අෂ්ඨායර්‍ය පුද්ගල කෙනෙක් වෙත්ද ? නොයෙක් ලෙසින් පසස්නා ලද එක සිය අටක් වූ ආයර්‍ය පුද්ගල කෙනෙක් වෙත්ද ඔවුහු යුගල සතරකි. බුද්ධ ශ්‍රාවක වූ ඒ ආයර්‍ය පුද්ගලයෝ දක්ෂිණාවට සුදුසු වෙති. ඔවුන් කෙරෙහි දුන් දානයෝ මහත් ඵල ඇත්තාහු වෙති. මෙයද සංඝයා වහන්සේ කෙරෙහි ප්‍රණීත රත්න භාවයකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා !

07 යෙ සුප්පයුත්තා මනසා දළ්හෙන
නික්කාමිනො ගොතම සාසනම්හි
තෙ පත්තිපත්තා අමතං විගය්හ
ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

යම් රහත් කෙනෙක් ගෞතම ශාසනයෙහි මනාකොට යෙදුනාහු ස්ථිර සිතින් සියලු කෙලෙසුන් ගෙන් නික්මුණාහු ද ? ඔවුහු නිවනට අරමුණු වශයෙන් බැස ඵල සමවත් සුවය නොමිලයේ ලැබ අනුභව කරන්නාහු. මෙයද සංඝයා වහන්සේ කෙරෙහි ප්‍රණීත රත්න භාවයකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා !

08 යථින්දඛීලො පඨවිංසිතො සියා
චතුබ්භි වාතෙහි අසම්ප කම්පියො
තථූපමං සප්පුරිසං වදාමි
යො අරියසච්චානි අවෙච්ච පස්සති
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

ඉන්ද්‍රඛීලය නම් වූ කණුව යම් සේ පොළොව ඇතුළට පිවිස සිටියේ සිවු දෙසින් හමන සුළඟින් සොලවාලිය නොහැකි වන්නේද ? යමෙක් ආර්‍ය්‍ය සත්‍යයන් නුවණින් බැස දකී නම් ඒ සත්පුරුෂයා එබඳු ඉන්ද්‍රඛීලය හා සමාන කොට කියමි. මෙයද සංඝයා වහන්සේ කෙරෙහි ප්‍රණීත රත්න භාවයකි.මේ සත්‍ය බලයෙන් සත්වයිනට සෙත් වේවා !

09 යෙ අරියසච්චානි විභාවයන්ති
ගම්භීර පඤ්ඤෙන සුදෙසිතානි
කිඤ්චාපි තෙ හොන්ති භුසප්පමත්තා
න තෙ භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

යමෙක් ගැඹුරු නුවණැති සර්‍වඥයන් වහන්සේ විසින් මැනවින් දේශනා කරන ලද ආර්‍ය්‍ය සත්‍ය ධර්‍මයන් තමන් කෙරෙහි ප්‍රකට කෙරෙත් ද ඔවුහු කිසිසේත් පමාවුවෝ නොවෙත් ද, ඔවුහු අටවන භවයක් නම් නොගනිති. මෙයද සංඝයා කෙරෙහි ශ්‍රේෂ්ඨ රත්න භාවයකි. මේ සත්‍ය බලයෙන් ඔබට සෙත් වේවා !

10 සහාවස්ස දස්සනසම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති
සක්කායදිට්ඨි විචිකිච්ඡිතඤ්ච
සීලබ්බතං වාපි යදත්ථි කිඤ්චි
චතූහපායෙහි ච විප්පමුත්තො
ඡච්චාභිඨානානි අභබ්බො කාතුං
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

දර්‍ශන සමාපත්තිය සමඟම සක්කාය දිට්ඨියද, විචිකිච්ඡාවද, සීලබ්බත පරාමාසයද යන සංයෝජන ධර්ම තුන ඔහු විසින් හරණ ලද්දහු වෙති. හේ සතර අපායෙන් මිදුනේ වෙයි. පඤ්චානන්තර්‍ය්‍ය කර්ම කිරීමට හා අන්‍ය ශාස්තෲවරයෙකුද ඇදහීමට සුදුසු නොවේ. මෙයද සංඝයා කෙරෙහි ශ්‍රේෂ්ඨ රත්න භාවයකි.මේ සත්‍ය බලයෙන් සත්වයින්ට සෙත් වේවා !

11 කිඤ්චාපි සො කම්මං කරොති පාපකං
කායෙන වාචා උද චෙතසා වා
අභබ්බො සො තස්ස පටිච්ඡාදය
අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

ඒ සෝවාන් පුද්ගල තෙමේ තිදොරින් යම් පවක් කෙරේ ද ? හෙතෙම එය සඟවාලීමට නොහැක්කේ වෙයි. නිවන් දුටුවහුගේ පව් සැඟවීමෙහි නොහැකි බව බුදුන් වහන්සේ විසින් දෙසන ලදී. මෙයද සංඝයා වහන්සේ කෙරෙහි ප්‍රණීත රත්න භාවයකි. මේ සත්‍ය බලයෙන් සත්වයිනට සෙත් වේවා !

12 වනප්පගුම්බෙ යථාඵුස්සිතග්ගෙ
ගිම්හානමාසෙ පඨමස්මිං ගිම්හෙ
තථූපමං ධම්මවරං අදෙසයි
නිබ්බානගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

ග්‍රීෂ්ම ඍතුවේ පළමු මාසයෙහි හෙවත් බක් මස වන ලැහැබක පිපුණු මල් යම්සේ බරවේද එසේම නිවනට පමුණුවන ධර්ම රත්නය නිවන් සුව පිණිසම ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ දෙසූ සේක්ද එම බුද්ධ රත්නය ඉතා උතුම්ය. මේ උතුම් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා!

13 වරො වරඤ්ඤූ වරදො වරාහරො
අනුත්තරො ධම්මවරං අදෙසයි
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

උතුම් වූ නිවන දන්නා වූ නිවන දෙන්නා වූ ශ්‍රේෂ්ඨ බුදුරජාණන් වහන්සේ උතුම් ධර්මයක් දෙසූ සේක. මෙයද බුදුරජාණන් වහන්සේ කෙරෙහි වූ ශ්‍රේෂ්ඨ වූ රත්න භාවයකි. මේ සත්‍ය බලයෙන් සත්වයිනට සෙත් වේවා !

14 ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්තචිත්තා ආයතිකෙ භවස්මිං
තෙඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථායම්පදීපො
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

යම් කෙනෙකුන්ගේ පුරාණකර්ම ගෙවී ගියේ ද අලුතින් ඇතිවන කර්මයකුත් නැත්ද, මතු භවයෙහි නො ඇළුණු සිත් ඇති ක්ෂය කළ ප්‍රතිසන්ධි විඥාන බීජ ඇති වැඩෙන ඡන්දයක් නැති ඒ ධෘතිමත් රහත්හු මේ නිවුණු පහන් මෙන් පිරිනිවෙති. මෙයද සංඝයා කෙරෙහි වූ උතුම් රත්න භාවයකි. මේ සත්‍ය බලයෙන් සත්වයිනට සෙත් වේවා !

15 යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛෙ
තථාගතං දෙවමනුස්ස පූජිතං
බුද්ධං නමස්සාම සුවත්ථි හොතු

පොළොවෙහි හෝ අහසෙහි හෝ අමනුෂ්‍ය කෙනෙක් මෙතැන්හි රැස්ව සිටිත්ද ඒ අප දෙව් මිනිසුන් විසින් පුදන ලද බුදුරදුන් වඳිමු. මේ සත්‍යබලයෙන් සත්වයිනට සෙත් වේවා !

16 යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛෙ
තථාගතං දෙවමනුස්ස පූජිතං
ධම්මං නමස්සාම සුවත්ථි හොතු

පොළොවෙහි හෝ අහසෙහි හෝ අමනුෂ්‍ය කෙනෙක් මෙතැන්හි රැස්ව සිටිත්ද ඒ අප දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත දේශිත ධර්මය වඳිමු.

17 යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛෙ
තථාගතං දෙවමනුස්ස පූජිතං
සංඝං නමස්සාම සුවත්ථි හොතු

පොළොවෙහි හෝ අහසෙහි හෝ අමනුෂ්‍ය කෙනෙක් මෙතැන්හි රැස්ව සිටිත්ද ඒ අප දෙව් මිනිසුන් විසින් පුදන ලද ශ්‍රාවක සංඝයා වහන්සේ වඳිමු.

## කරණීය මෙත්ත සූත්‍රය

01 කරණීයමත්ථකුසලෙන - යං තං සනතං පදං අභිසමෙච්ච
සක්කො උජූච සුජූච - සුවචො චස්ස මුදු අනතිමානි

ශාන්ත පදයට පැමිණ වසනු කැමැත්තහු විසින් යමක් කළ යුතුද ? අභිවෘද්ධියෙහි දක්ෂයා එය කළ යුතුය. හෙතෙම සමතෙක් වන්නේ ය. අවංක වන්නේ ය. මැනවින් අවංක වන්නේ ය. කීකරු වන්නේ ය. මෘදු වන්නේ ය. නිහතමානී වන්නේය.

02 සනතුස්සකො ච සුභරො ච - අප්ප කිච්චො ච සල්ලහුකවුත්ති
සනතින්ද්‍රියො ච නිපකො ච - අප්පගබ්භො කුලෙසුඅනනුගිද්ධො

සන්තෝෂ ඇත්තෙක් වන්නේ ය. පහසුවෙන් පෝෂණය කළ හැක්කෙක් වන්නේ ය. ස්වල්ප කටයුතු ඇත්තෙක් වන්නේ ය. සැහැල්ලු පැවතුම් ඇත්තෙක් වන්නේ ය. සන්සුන් ඉඳුරන් ඇත්තෙක් වන්නේ ය. ප්‍රඥාවන්තයෙක් වන්නේය. හැඩිදැඩි නොවන්නේ ය. කුලයන්හි නොඇලෙන්නේ ය.

03 නච ඛුද්දං සමාචරෙ කිංචි - යෙන විඤ්ඤූ පරෙ උපවදෙය්‍යුං
සුඛිනො වා ඛෙමිනො හොනතු - සබ්බ සතතා භවනතු සුඛිතතතා

යම් ක්‍රියාවක් නිසා නුවණැති අන්‍යයෝ නින්ද කෙරෙති නම් එබඳු කුඩා වූ වරදක් පවා නොකරන්නේ ය. සියලු සත්හු සුව ඇත්තෝ භය නැත්තෝ වෙත්වා ! සියලු සත්හු සුවයෙන් යුතු සිත් ඇත්තෝ වෙත්වා !

04 යෙ කෙචි පාණ භූතත්ථි - තසා වා ථාවරා වා අනවසෙසා
දීඝා වා යෙ මහනතා වා - මජ්ඣිමා රස්සකාණුකථූලා

කෙලෙස් ඇති සත්වයෝද කෙලෙස් රහිත සත්වයෝද යන සියලු ප්‍රාණභූත සත්ව කෙනෙක් වෙත්ද දික් වූ හෝ මහත් වූ හෝ මධ්‍යම වූ හෝ කුඩා ශරීර ඇත්තා වූ හෝ ඉතා කුඩා වූ හෝ ස්ථූල වූ සත්වයෝ වෙත්ද ?

05 දිට්ඨා වා යෙව අද්දිට්ඨා - යෙ ච දූරෙ වසනති අවිදූරෙ
භූතා වා සමභවෙසී වා - සබ්බ සතතා භවනතු සුඛිතතතා

තම ඇසට පෙනෙන්නා වූ නොපෙනෙන්නා වූ සත්වයෝ වෙත්ද යම් සත්ව කෙනෙක් දුර හෝ වසත්ද ළඟ හෝ වසත්ද උපන්නා වූ යම් සත්ව කෙනෙක් වෙත්ද ඉපැදෙමින් සිටින යම් සත්ව කෙනෙක් වෙත් ද ? ඒ සියළු සත්හු සුවපත් වෙත්වා !

06 න පරො පරං නිකුබ්බෙථ - නාතිමඤ්ඤෙථ කත්ථචිනං කඤ්චි
බ්‍යාරොසනා පටිඝසඤ්ඤා - නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය

අනෙකෙක් අනෙකකු නො රවටන්නේ ය. කිසි තැනෙක්හි ඒ කිසිවෙකුට අවමන් නොකරන්නේ ය. කය වචන දෙකින් කරන රෝෂණයෙන් ද සිතින් කරන ක්‍රෝධයෙන්ද ඔවුනොවුන්ට දුක් නොකැමති වන්නේ ය.

07 මාතා යථා නියංපුත්තං - ආයුසා එකපුත්තමනුරක්ඛෙ
එවම්පි සබ්බභූතෙසු - මානසං භාවයෙ අපරිමාණං

යම් සේ මවු තොමෝ ආයුෂයෙන් ස්වකීය පුත්‍රයා රකී ද එසේ ම සියලු සතුන් කෙරෙහි අප්‍රමාණ මෛත්‍රී සිත වඩන්නේ ය.

08 මෙත්තං ච සබ්බලොකස්මිං - මානසං භාවයෙ අපරිමාණං
උද්ධං අධො ච තිරියංච - අසම්බාධං අවෙරං අසපත්තං

පමණ රහිත වූ එසේම පීඩා රහිත වූ වෛර චේතනා රහිත වූ සතුරන් රහිත වූ සිතෙහි වූ මෛත්‍රියද උඩ යට සරස යන සියලු සත්ව ලෝකයෙහි මෙත් සිත වඩන්නේ ය.

09 තිට්ඨං චරං නිසින්නො වා-සයානො වා යාවතස්ස විගතමිද්ධො
එතං සතිං අධිට්ඨෙය්‍ය - බ්‍රහ්මමෙතං විහාරං ඉධමාහු

සිටිමින් හෝ යමින් හෝ හිඳිමින් හෝ සයනය කරමින් හෝ යම්තාක් කල් නොනිඳා ද ඒතාක් කල් මෛත්‍රී ස්මෘතිය වඩන්නේ ය.

10 දිට්ඨිංච අනුපගම්ම සීලවා - දස්සනෙන සම්පන්නො
කාමෙසු විනෙය්‍ය ගෙධං - නහි ජාතු ගබ්භසෙය්‍යං පුනරෙතී ති

මිථ්‍යා දෘෂ්ටියට නො පැමිණ ශෝතාපන්න මාර්ග ඥාන දර්ශනයෙන් යුක්ත වුයේ වස්තුකාමයෙහි ගිජු බව හෙවත් ක්ලේශ කාමය සකෘදගාමී අනාගාමී මාර්ග දෙකින් ප්‍රහීණ කොට ඒකාන්තයෙන්ම මවු කුස පිළිසිඳ ගැනීමට නැවත නොපැමිණෙන්නේ ය.

# ආරක්ෂක පිරිත් දේශනා

සබ්බීතියො විවජ්ජනතු - සබබ රොගො විනසසතු
මාතෙ භවත්වනතරායො - සුඛී දීඝායුකො භව

භවතු සබබ මංගලං - රකඛනතු සබබදෙවතා
සබබ බුද්ධානු භාවෙන - සදා සොත්ථි භවනතු මෙ (තෙ)

භවතු සබබ මංගලං - රකඛනතු සබබදෙවතා
සබබ ධම්මානු භාවෙන - සදා සොත්ථි භවනතු මෙ (තෙ)

භවතු සබබ මංගලං - රකඛනතු සබබදෙවතා
සබබ සංඝානු භාවෙන - සදා සොත්ථි භවනතු මෙ (තෙ)

නකඛතත යකඛ භූතානං - පාපගගහ නිවාරණා
පරිතතසසානු භාවෙන - හනතු තෙසං උපද්දවෙ

යනදුනනිමිතතං අවමංගලඤ්ච - යොචා මනාපොසකුණසස සද්දො
පාපගගහො දුසසුපිනං අකනතං - බුද්ධානුභාවෙන විනාස මෙනතු

යනදුනනිමිතතං අවමංගලඤ්ච - යොචා මනාපොසකුණසස සද්දො
පාපගගහො දුසසුපිනං අකනතං - ධම්මානුභාවෙන විනාස මෙනතු

යනදුනනිමිතතං අවමංගලඤ්ච - යොචා මනාපොසකුණසස සද්දො
පාපගගහො දුසසුපිනං අකනතං - සංඝානුභාවෙන විනාස මෙනතු

දානං දදනතු සද්ධාය - සීලං රකඛනතු සබබදා
භාවනාභි රතා හොනතු - ගචඡනතු දෙවතා ගතා

දුකඛපපතතාච නිද්දුකඛා - භයපපතතාච නිබභයා
සොකපපතතාච නිසෙසාකා - හොනතු සබෙබපි පාණිනො

සබෙබ බුද්ධා බලපපතතා - පචෙච කානඤ්චයං බලං
අරහනතානඤ්ච තෙජෙන - රකඛං බනධාමි සබබසො

# ඥාතීන්ට දෙවියන්ට පින්දීම

## ඥාතීන්ට පින්දීම

ඉදං වො ඥාතීනං හොතු - සුඛිතා හොනතු ඥාතයො
ඉදං වො ඥාතීනං හොතු - සුඛිතා හොනතු ඥාතයො
ඉදං වො ඥාතීනං හොතු - සුඛිතා හොනතු ඥාතයො

## දෙවියන්ට පින් දීම

එතතාවතාච අමෙහහි - සමභතං පුඤඤ සමපදං
සබෙබ දෙවා අනුමොදනතු - සබබ සමපතති සිදධියා

එතතාවතාච අමෙහහි - සමභතං පුඤඤ සමපදං
සබෙබ භූතා අනුමොදනතු - සබබ සමපතති සිදධියා

එතතාවතාච අමෙහහි - සමභතං පුඤඤ සමපදං
සබෙබ සතතා  අනුමොදනතු - සබබ සමපතති සිදධියා

ආකාසටඨාච භුමමටඨා - දෙවානාගාමහිදධිකා
පුඤඤනතං අනුමොදිතවා - චිරං රකඛනතු සාසනං

ආකාසටඨාච භුමමටඨා - දෙවානාගාමහිදධිකා
පුඤඤනතං අනුමොදිතවා - චිරං රකඛනතු දෙසනං

ආකාසටඨාච භුමමටඨා - දෙවානාගාමහිදධිකා
පුඤඤනතං අනුමොදිතවා - චිරං රකඛනතු මං පරං

## විහාරයේ ආරාමයේ සිටින දෙවියන්ට පින්දීම

අසමිං විහාරෙචාරාමෙ (අරඤඤ ඛෙතතමහි)
අධිවතථාච දෙවතා
අනුමොදිතවා නිමං පුඤඤං
රකඛනතු ජිනං සාසනං

## සියලු සත්ත්වයන්ට පින් දීම

සබ්බෙ සත්තාච මජ්ඣත්තා - හිතාච අහිතාචමෙ
අනුමෝදිත්වා නිමං පුඤ්ඤං - භුඤ්ජන්තු අමතං පදං

## මෛත්‍රී බෝධිසත්වයන්ට පින් දීම

කප්ප සත සහස්සානි - සොළසාපි අසංඛියෙ
සම්භරං බොධි සම්භාරෙ - ආගතො ජාති ජාති සු
නියතො බුද්ධ භාවාය - භද්ද කප්පෙ ඉධන්තිමෙ
බොධි සත්තොච මෙත්තෙය්‍යො - පුඤ්ඤං මෙ අනුමොදතු

## ලෝක පාලන දෙවියන්ට පින්දීම හා පුණ්‍ය ප්‍රාර්ථනා

චත්තාරොච මහා රාජා - සක්කො චාපි සුරා පරෙ
අනුමෝදිත්වා නිමං පුඤ්ඤං - රක්ඛන්තු ජිනං සාසනං

චිරං තිට්ඨතු ලොකස්මිං - සම්මා සම්බුද්ධ සාසනං
තස්මිං සගාරවා නිච්චං - හොන්තු සබ්බෙ පි පාණිණො

සම්මා වස්සතු කාලෙන - දෙවොච ජගතී පතී
සද්ධම්ම නිරතො ලොකං - ධම්මෙනෙව පසාසතු

යං පත්තං කුසලං තස්ස - අනුභාවෙන පාණිනො
සබ්බෙ සද්ධම්ම රාජස්ස - ඤත්වා ධම්මං සුඛාවහං

පාපු නන්තු විසුද්ධාය - සුඛාය පටිපත්තියා
අසොක මනු පායාසං - නිබ්බාන සුඛ මුත්තමං

චිරං තිට්ඨතු සද්ධම්මො - ධම්මෙ හොන්තු සගාරවා
සබ්බපි සත්තා කාලෙන - සම්මා දෙවො පවස්සතු

යථා රක්ඛිංසු පොරාණා - සුරාජානො තථෙවිමං
රාජාරක්ඛන්තු ධම්මෙන - අත්තනොව පජංපජං

## කල්‍යාණ මිත්‍ර සම්පත්තිය ප්‍රාර්ථනා කිරීම

ඉමිනා පුඤ්ඤ කම්මේන - මාමේ බාල සමාගමෝ
සතං සමාගමෝ හොතු - යාව නිබ්බාන පත්තියා ///

ඉමිනා පුඤ්ඤ කම්මේන - මාමේ බාල සමාගමෝ
සතං සමාගමෝ හොතු - යාව නිබ්බාන පත්තියා ///

ඉමිනා පුඤ්ඤ කම්මේන - මාමේ බාල සමාගමෝ
සතං සමාගමෝ හොතු - යාව නිබ්බාන පත්තියා ///

## නිවන් අවබෝධය ප්‍රාර්ථනා කිරීම

ඉදං මෙ පුඤ්ඤ කම්මං ආසවක්ඛයාවහං හොතු සබ්බ දුක්ඛා පමුඤ්චතු

## ප්‍රතිපත්ති පූජාව

ඉමාය ධම්මානු ධම්ම පටිපත්තියා බුද්ධං පූජේමි
ඉමාය ධම්මානු ධම්ම පටිපත්තියා ධම්මං පූජේමි
ඉමාය ධම්මානු ධම්ම පටිපත්තියා සංඝං පූජේමි
අද්ධා ඉමාය පටිපත්තියා ජාති ජරා මරණම්හා පරිමුච්චිස්සාමි

## තුණුරුවන් සමාකර ගැනීම

කායෙන වාචා චිත්තෙන - පමාදෙන මයා කතං
අච්චයං ඛමථ මෙ භන්තෙ - භූරි පඤ්ඤ තථාගත

කායෙන වාචා චිත්තෙන - පමාදෙන මයා කතං
අච්චයං ඛමථ මෙ ධම්ම - සන්දිට්ඨික අකාලික

කායෙන වාචා චිත්තෙන - පමාදෙන මයා කතං
අච්චයං ඛමථ මෙ සංඝ - පුඤ්ඤක්ඛෙත්ත අනුත්තර

## උදේ සවස භාවිතා කළ යුතු ආරක්ෂක ගාථා

බුද්ධං සුද්ධ ගුණාකරං දසබලං - දේවාති දේවං ජිනං
ධම්මං තේන සුදේසිතං භවනුදං - දුක්ඛා පගං නිම්මලං
සංඝාචාපි නිරංගණං මුනිසුතං - වන්දාමහං මුද්ධනා
බුද්ධො ධම්ම වරො තථාගත ගණො
පාලෙන්තුතෙ, (ත්වං) මං සදා

සාධු ! සාධු !! සාධු !!!

## පින් අනුමෝදන් වීම සහ අනුමෝදන් කරවීම

"ඕකාස වන්දාමි භන්තෙ"
"අවසරයි ස්වාමීන් වහන්ස" මම වන්දනා කරමි.

"මයාකතං පුඤ්ඤං සාමිනා අනුමොදිතබ්බං"
මා විසින් රැස්කර ගන්නා ලද පින ගරු ස්වාමීන් වහන්සේ අනුමෝදන් වන සේක්වා.

සාමිනා කතං පුඤ්ඤං මයහං දාතබ්බං
ගරු ස්වාමීන්වහන්සේ විසින් කරන ලද පින මටද දෙන සේක්වා.

සාධු ! සාධු ! අනුමොදාමි
සාධු ! සාධු ! අනුමෝදන් වෙමි.

ඕකාස ද්වාරත්තයෙන කතං සබ්බං අච්චයං ඛමථ මෙ භන්තෙ
"අවසර ස්වාමීන් වහන්ස" මගේ තුන්දොරින් සිදුවූ සියලු පමා වරදට සමාවන සේක්වා. !

ඕකාස ඛමාමි භන්තෙ
අවසර ස්වාමීනි, මමද සමා වෙමි.

## ගරු ස්වාමීන් වහන්සේලාට වන්දනා කරන ගාථා

සීලවනතං ගුණවනතං - පුඤඤකෙඛතතං අනුතතරං
දුලලභෙන මයා ලදධං - පසසිතුං වනදිතුං වරං
සාරිපුතතාදි ථෙරානං - ආගතං පටිපාටියා
සදධා සීලං දයාවාසං - බුදධ පුතතං නමාමහං

චිං තිටඨතු සාසනං

සම්බුද්ධ සාසනය බොහෝකල් පවතීවා

සාධු ! සාධු !! සාධු !!!

# අටවිසි බුද්ධ වන්දනාව

සතත විතත කිතතිං පාපධමමපපහීනං
තිභව හිත විධානං සබබලොකෙක නාථං
අමිත මති මනගඝං සනතිදං මෙරු සාරං
සුගත මහ මුදාරං රූපසාරං නමාමි

දසත පැතිර පවත්නා වූ ගුණ කීර්තියක් ඇති, සියළු පාප ධර්මයන් මැනවින් ප්‍රහානය කළා වූ, තුන් ලෝක වාසීන්ට අසහාය පිහිටක් වූ, මහත් ගුණ සමුදායකින් හා ඍදාණ සම්පත්තියකින් යුක්ත, වූ දෙතිසක් මහා පුරුෂ ලක්‍ෂණයන්ගෙන් බබළන්නා වූ, අසූවක් අනු ව්‍යංජන ලක්‍ෂණයන්ගෙන් සෝභමාන වූ, දෙසිරිපාදයෙහි චක්‍ර ලක්‍ෂණයන්ගෙන් හා දෙසීය සොළොසක් මංගල ලක්‍ෂණයන්ගෙන් විරාජමාන වූ, සූවිසිකෙළ ලක්ෂ වාරයක් අර්හත් ඵල සමාපත්ති සංඛ්‍යාත වජ්‍රඥානයන්ගෙන් සමන්නා ගත වූ, දේවාති දේව වූ, ශක්‍රාති ශක්‍ර වූ, බ්‍රහ්මාති බ්‍රහ්ම වූ, සමන්ත භද්‍ර වූ, බුදුරජාණන් වහන්සේලාට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

## 01 තණ්හංකර බුදුරජාණන් වහන්සේ පූජා ගාථාව

දීපෙහි ගනධ ධූපෙහි - ගිලාන පචචයෙහිච
පුපඵා දි වතථු ජාතෙහි - සුදෙධහි කපපියෙහිච
අනනත ගුණ ධාරෙනතං - නාථං තණහංකරං ජිනං
සුදධ චිතතපපසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, පස්මරුන් දිනූ සත්වයන්ට පිහිට වූ අනන්ත මහා ගුණය දරන්නා වූ තණ්හංකර බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු! සාධු!! සාධු!!!

## තණ්හංකර බුදුරජාණන් වහන්සෙ වන්‍දනා ගාථා

01 සො භගවා තණ්‍හංකරො ඉතිපි සම්මා සම්බුද්ධො
සම්මා සම්බුද්ධො වත සො තණ්‍හංකරො භගවා
තං සම්මා සම්බුද්ධං තණ්‍හංකරං භගවන්තං සරණං ගච්ඡාමි.
තං සම්මා සම්බුද්ධං තණ්‍හංකරං භගවන්තං සිරසා නමාමි.
සාධු ! සාධු ! සාධු !

ඒ තණ්හංකර බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ තණ්හංකර බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ තණ්හංකර බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ තණ්හංකර බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !
සාධු ! සාධු ! සාධු !

තණ්‍හංකරං මහා වීරං මුනින්‍දං ලොක නායකං
සත්තපණ්ණිං මහා බොධිං නමාමි සිරසාදරං

එසෙස පුරෙ භවි බොධි ච සත්තපණ්ණී
තස්මිං ඨිතො විජිත මාර මිතො ගුණො සො
වස්සං සහස්ස ගුණිතං සතමායු තස්ස
තණ්‍හංකරස්ස මුනිපාද මහං නමාමි

මේ මහා භද්‍ර කල්පයට සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයකින් මත්තෙහි සේල නම් අසංඛ්‍ය තුළ සාරමණ්ඩ නම් කල්පයෙහි දී ලොව පහළ වී වදාළ තුන් ලොවට නායක වූ මහත් වීර්යයකින් යුක්ත වූ "තණ්හංකර" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් වූ සේක්ද ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සඳහා පිට දී වදාළ "සප්තපර්ණී" නම් ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු ! සාධු !

## 02 මේධංකර බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගන්‍ධ ධූපෙහි - ගිලාන පච්චයෙහිච
පුප්ඵා දි වත්ථු ජාතෙහි - සුද්ධෙහි කප්පියෙහිච
අනන්ත සිරි ධාරෙන්තං - නාථං මෙධංකරං ජිනං
සුද්ධ චිත්තප්පසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, පස්මරුන් දිනූ සත්වයන්ට පිහිට වූ අනන්ත සිරිය දරන්නා වූ මේධංකර බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භක්‍යාදරයෙන් පූජා කරමි පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## මේධංකර බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

02 සො භගවා මෙධංකරො ඉතිපි සමමා සමබුදෙධා
සමමා සමබුදෙධා වත සො මෙධංකරො භගවා
තං සමමා සමබුදධං මෙධංකරං භගවනතං සරණං ගචඡාමි
තං සමමා සමබුදධං මෙධංකරං භගවනතං සිරසා නමාමි

ඒ මේධංකර බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ මේධංකර බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ මේධංකර බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ මේධංකර බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා

සාධු ! සාධු !! සාධු !!!

මහායසං ලොකනාථං මෙධංකරං වීනායකං
කිංසු කං තසස බොධිංච නමාමි සිරසාදරං
ආසී ච මෙබලං පුරං කිංසුකොසීති බොධිං
තසමිං ඨිතො විජිත මාර මිතො ජුතී සො
වසසං සහසස ගුණිතං නවුතායු තසස
මෙධංකරසස මුනිපාද මහං නමාමි

එම සාරමණ්ඩ නම් කල්පයෙහිදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලෝක සත්වයන් මනා කොට හික්මවන ලද්දා වූ මහත් යස පිරිවරින් යුක්ත වූ තුන් ලෝකවාසීන්ට මහත් පිටිවහලක් වූ "මේධංකර" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සඳහා පිට දී වදාළ "කෑළ" නම් ජය ශ්‍රී මහ බෝධින් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 03 සරණංකර බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගන්ධ ධූපෙහි - ගිලාන පච්චයෙහිච
පුප්ඵා දි වත්ථු ජාතෙහි - සුද්ධෙහි කප්පියෙහිච
අනන්ත ඉද්ධිං ධාරෙන්තං - නාථං සරණංකරං ජිනං
සුද්ධ චිත්තප්පසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, පස්මරුන් දිනූ සත්වයන්ට පිහිට වූ අනන්ත ඉර්ධිය දරන්නා වූ සරණංකර බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## සරණංකර බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

03 සො භගවා සරණංකරො ඉතිපි සම්මා සම්බුද්ධො
සම්මා සම්බුද්ධො වත සො සරණංකරො භගවා
තං සම්මා සම්බුද්ධං සරණංකරං භගවන්තං සරණං ගච්ඡාමි
තං සම්මා සම්බුද්ධං සරණංකරං භගවන්තං සිරසා නමාමි.

සාධු ! සාධු !! සාධු !!!

ඒ සරණංකර බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සරණංකර බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සරණංකර බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ සරණංකර බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

දෙව දෙව මහා වීරං මහෙසිං සරණංකරං
පිප්ඵලිංච මහා බොධිං නමාමි සිරසාදරං

ආසී ච වීපුල පුරං පිප්ඵලීසීති බොධී
තස්මිං ඨිතො විජිත මාර මිතො මතී සො
වස්සං සහස්ස ගුණිතම්පි අසීති තස්ස
සරණංකරස්ස මුනිපාද මහං නමාමි

එම සාරමණ්ඩ නම් කල්පයෙහිදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලොව පහල වී වදාළා වූ දෙවියන්ට දෙවි වූ මහත් වික්‍රමයකින් යුක්ත වූ මහත් ඍෂි සමූහයා විසින් පිරිවරා ගන්නා ලද "සරණංකර" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සඳහා පිට දී වදාළ "පුලිල" නම් ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 04 දීපංකර බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගන්ධ ධූපෙහි - ගිලාන පච්චයෙහිච
පුප්ඵා දි වත්‍ථු ජාතෙහි - සුද්ධෙහි කප්පියෙහිච
අනන්ත ඤාණං ධාරෙන්තං - නාථං දීපංකරං මුනිං
සුද්ධ චිත්තප්පසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, පස්මරුන් දිනූ සත්වයන්ට පිහිට වූ අනන්ත ඤාණය දරන්නා වූ දීපංකර මුනින්ද්‍රයන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## දීපංකර බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

04 සො භගවා දීපංකරො ඉතිපි සම්මා සම්බුද්ධො
සම්මා සම්බුද්ධො වත සො දීපංකරො භගවා
තං සම්මා සම්බුද්ධං දීපංකරං භගවන්තං සරණං ගච්ඡාමි.
තං සම්මා සම්බුද්ධං දීපංකරං භගවන්තං සිරසා නමාමි.

ඒ දීපංකර බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ දීපංකර බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ දීපංකර බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ දීපංකර බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

ජුතිංධරං මහා නාගං දීපංකරං මහා මුනිං
පිපඵලිංච මහා බොධිං නමාමි සිරසාදරං

රමෙමපුරෙ හවි පිපඵලි බොධි රාජං
තසමිං ඨිතො විජිත මාර මිතො යසො සො
වසසං සහසස ගුණිතමපි සතමායු තසස
දීපංකරසස මුනිපාද මහං නමාමි

එම සාරමණ්ඩ නම් කල්පයෙහිදීම නැවත බුද්ධාන්තරයකින් පසුව මහානර්ඝ වූ ප්‍රඥා ලෝකයෙන් මෝහන්ධකාරය දුරුකොට තුන් ලොව එකෙළි කලා වූ "දීපංකර" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සඳහා පිට දී වදාළ "පුලිල" නම් ජය ශ්‍රී මහ බෝධින් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 05 කොණ්ඩඤ්ඤ බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගනධ ධූපෙහි - ගිලාන පචචයෙහිච
පුපඵා දි වතථු ජාතෙහි - සුදෙධහි කපපියෙහිච
අනනත පුඤඤඤං ධාරෙනතං - කොණඩඤඤං දවිපදුතතමං
සුදධ චිතතපපසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, පස්මරුන් දිනූ සත්වයන්ට පිහිට වූ අනන්ත පිං ගුණය දරන්නා වූ කොණ්ඩඤ්ඤ දිපදෙත්තමයන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## කොණ්ඩඤ්ඤ බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

05 සො භගවා කොණ්ඩඤ්ඤො ඉතිපි සම්මා සම්බුද්ධො
සම්මා සම්බුද්ධො වත සො කොණ්ඩඤ්ඤො භගවා
තං සම්මා සම්බුද්ධං කොණ්ඩඤ්ඤං භගවන්තං සරණං ගච්ඡාමි
තං සම්මා සම්බුද්ධං කොණ්ඩඤ්ඤං භගවන්තං සිරසා නමාමි.

ඒ කොණ්ඩඤ්ඤ බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ කොණ්ඩඤ්ඤ බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ කොණ්ඩඤ්ඤ බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ කොණ්ඩඤ්ඤ බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

මුනින්දං ජනපා මොක්ඛං කොණ්ඩඤ්ඤං ලොක පූජිතං
සාල බොධිංච කල්‍යාණං නමාමි සිරසාදරං

රම්මපුරෙ භවි මහිද්ධික බොධි සාලං
තස්මිං ඨිතො විජිත මාර මනන්ත ඤාණො
වස්සං සහස්ස ගුණිතං සතමායු තස්ස
කොණ්ඩඤ්ඤ තස්ස මුනිපාද මහං නමාමි

නැවත බුද්ධ ශූන්‍ය වූ කල්ප අසංඛ්‍යයකින් පසුව සාර නම් වූ කල්පයෙහි සියලූ ජනයාට ශ්‍රේෂ්ඨ වූ සියලූ ලෝ වැසියන් විසින් පුදන ලද්දා වූ "කොණ්ඩඤ්ඤ" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සඳහා පිට දී වදාළ "සාල කල්‍යාණ" නම් ජය ශ්‍රී මහ බෝධින් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 06 මංගල බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගන්ධ ධූපෙහි - ගිලාන පච්චයෙහිච
පුප්ඵා දි වත්ථු ජාතෙහි - සුදෙධහි කප්පියෙහිච
අනන්ත ගුණ ධාරෙනතං - මංගලං මුනිං සම්බුද්ධං
සුද්ධ චිත්තප්පසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! භාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, පස්මරුන් දිනූ සත්වයන්ට පිහිට වූ අනන්ත ගුණය දරන්නා වූ මංගල නම් සම්මා බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## මංගල බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

06 සො භගවා මංගලො ඉතිපි සම්මා සම්බුද්ධො
සම්මා සම්බුද්ධො වත සො මංගලො භගවා
තං සම්මා සම්බුද්ධං මංගලං භගවන්තං සරණං ගච්ඡාමි
තං සම්මා සම්බුද්ධං මංගලං භගවන්තං සිරසා නමාමි

ඒ මංගල බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ මංගල බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ මංගල බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ මංගල බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

ලොකාලොක කරං සෙට්ඨං මංගලං පුරිසුත්තමං
නාග බොධිංච කල්‍යාණං නමාමි සිරසාදරං

රම්මං පුරුත්තර පුරං භවි නාගබොධිං
තස්මිං ඨිතො විජිත මාර මනන්ත පුඤ්ඤො
වස්සං සහස්ස ගුණිතං නවුතායු තස්ස
තං මංගලස්ස මුනිපාද මහං නමාමි

නැවත බුද්ධ ශූන්‍ය වූ කල්ප අසංඛ්‍යයකින් පසුව සාරමණ්ඩ නම් වූ කල්පයෙහි තුන් ලොව ඒකාලෝක කළා වූ නර ශ්‍රේෂ්ඨ වූ නරෝත්තම වූ "මංගල" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද උන්වහන්සේ, බුදුවීම සඳහා පිට දී වදාළ "නාග කල්‍යාණ" නම් ජය ශ්‍රී මහ බෝධින් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 07 සුමන බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගනධ ධූපෙහි - ගිලාන පචචයෙහිච
පුපඵා දි වතථු ජාතෙහි - සුදෙධහි කපපියෙහිච
අනනත තෙජ ධාරෙනතං - සුගතං සුමනං ජිනං
සුදධ චිතතපපසාදෙන - භතයාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! භාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, සෝභන ගමනින් පස්මරුන් දිනූ අනන්ත තෙජස් දරන්නා වූ සුමන බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## සුමන බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

07 සො භගවා සුමනො ඉතිපි සමමා සමබුදෙධා
සමමා සමබුදෙධා වත සො සුමනො භගවා
තං සමමා සමබුදධං සුමනං භගවනතං සරණං ගචඡාමි
තං සමමා සමබුදධං සුමනං භගවනතං සිරසා නමාමි

ඒ සුමන බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සුමන බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සුමන බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ සුමන බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

සුමනාති සුමනං ධීරං සම්බුද්ධං සුමනං ජිනං
නාග බොධිංච කල්‍යාණං නමාමි සිරසාදරං

ආසීච මෙඛල පුරං භවි නාගබොධිං
තසමිං ධීතො විජිත මාර මනනත තෙජො
වසසං සහසස ගුණිතං නවුතායු තසස
සුමනසස තසස මුනිපාද මහං නමාමි

එම සාරමණ්ඩ නම් කල්පයෙහිදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලොව පහල වී වදාල නික්ලේෂී භාවයෙන් අතිපාරිශුද්ධ වූ ස්වයංභූ ඥානයෙන් සියළු ධර්මයෙන් අවබෝධ කොට වදාළා වූ පස්මරුන් දිනූ බැවින් ජිනෙන්ද්‍ර වූ "සුමන" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සදහා පිට දී වදාළ "නාග කල්‍යාණ" නම් ජය ශ්‍රී මහ බෝධින් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 08 රේවත බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගන්ධ ධූපෙහි - ගිලාන පච්චයෙහිච
පුප්ඵා දි වත්ථු ජාතෙහි - සුද්ධෙහි කප්පියෙහිච
අනන්ත ගුණ ධාරෙනතං - නාථං රෙවත මුත්තමං
සුද්ධ චිත්තප්පසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, සත්වයනට ශ්‍රේෂ්ඨ වූ අනන්ත ගුණය දරන්නා වූ රේවත බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## රේවත බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

08 සො භගවා රෙවතො ඉතිපි සමමා සමබුදෙධා
සමමා සමබුදෙධා වත සො රෙවතො භගවා
තං සමමා සමබුදධං රෙවතං භගවනතං සරණං ගචඡාමි.
තං සමමා සමබුදධං රෙවතං භගවනතං සිරසා නමාමි.

ඒ රේවත බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ රේවත බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ රේවත බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ රේවත බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

තිලොකදීපං සමබුදධං රෙවතං රති වඩඪනං
නාග බොධිංච කලයාණං නමාමි සිරසාදරං

පුබෙබ ච ධඤඤවතියා භවි නාගබොධිං
තසමිං ඨිතො විජිත මාර මනනත ඉදධි
වසසං සහසස ගුණිතං අහු සටඨී ආයු
තං රෙවතසස මුනිපාද මහං නමාමි

එම සාරමණ්ඩ නම් කල්පයෙහිදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලොව පහල වී වදාල තුන් ලොවට උතුම් ප්‍රදීපස්ථම්භයක් බඳු වූ චතුස් සත්‍ය ධර්මයෙන් මනාව අවබෝධ කළා වූ සියළු ලෝවැසියන්ගේ සිත් පහන් කළා වූ "රේවත" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සඳහා පිට දී වදාළ "නාග කලයාණ" නම් ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 09 සෝභිත බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගන්ධ ධූපෙහි - ගිලාන පච්චයෙහිච
පුප්ඵා දි වත්ථු ජාතෙහි - සුද්දෙධහි කප්පියෙහිච
අනන්ත ගුණ සම්පන්නං - සොභිතං ජින පුංගමං
සුද්ධ චිත්තප්පසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, පස්මරුන් දිනූ ලොවට නායක වූ අනන්ත ගුණ සම්පන්න වූ සෝභිත බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## සෝභිත බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

09 සො භගවා සොභිතො ඉතිපි සම්මා සම්බුද්ධො
සම්මා සම්බුද්ධො වත සො සොභිතො භගවා
තං සම්මා සම්බුද්ධං සොභිතං භගවන්තං සරණං ගච්ඡාමි.
තං සම්මා සම්බුද්ධං සොභිතං භගවන්තං සිරසා නමාමි.

ඒ සෝභිත බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සෝභිත බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සෝභිත බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ සෝභිත බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

ගුණාකරං මහා පුඤ්ඤං සොභිතං කරුණාධරං
නාග බොධිංච කල්‍යාණං නමාමි සිරසාදරං

පුබ්බෙ සුධම්ම නගරෙ භවි නාගබොධිං
තස්මිං ධීතො විජිත මාර මිතො ගුණො සො
වස්සං සහස්ස ගුණිතං නවුතායු තස්ස
තං සොභිතස්ස මුනිපාද මහං නමාමි

එම සාරමණ්ඩ නම් කල්පයෙහිදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලොව පහල වී වදාල සියළු ගුණයන්ට ආකරයක් බඳු වූ මහත් පුණ්‍ය තේජසින් යුක්ත වූ සියළු ලෝක සත්වයන් වෙත පතල මහා කරුණා ගුණයෙන් යුක්ත වූ "සෝභිත" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සඳහා පිට දී වදාළ "නාග කල්‍යාණ" නම් ජය ශ්‍රී මහ බෝධින් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 10 අනෝමදස්සි බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගන්ධ ධූපෙහි - ගිලාන පච්චයෙහිච
පුප්ඵා දි වත්ථු ජාතෙහි - සුදෙධහි කපපියෙහිච
අනනත ගුණ සමපනනං - අනොමදසසි ජිනුතතමං
සුදධ චිතතපපසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, පස්මරුන් දිනූ ලොවට නායක වූ අනන්ත ගුණ සම්පන්න වූ අනෝමදස්සි බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## අනෝමදස්සි බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

10 සො භගවා අනොමදසසී ඉතිපි සමමා සමබුදෙධා
සමමා සමබුදෙධා වත සො අනොමදසසී භගවා
තං සමමා සමබුදධං අනොමදසසිං භගවනතං සරණං ගචඡාමි.
තං සමමා සමබුදධං අනොමදසසිං භගවනතං සිරසා නමාමි.

ඒ අනෝමදස්සි බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ අනෝමදස්සි බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ අනෝමදස්සි බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ අනෝමදස්සි බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

අනොමදසසිං සමබුදධං ලොකනාථං ජනුතතමං
අජ්ජුනංනාම තං බොධිං නමාමි සිරසාදරං

චනෙද පුරමහි භවි අජ්ජුන බොධි රාජං
තසමිං ඨිතො විජිත මාර මිතො ජුතී සො
වසසං සහසස ගුණිතං සතමායු තසස
අනොමදසසි මුනිපාද මහං නමාමි

නැවත බුද්ධ ශූන්‍ය වූ කල්ප අසංඛ්‍යයකින් පසුව වරනම් කල්පයෙහි දී ලොව පහළ වී වදාළ තුන් ලොවට එකම පිහිටක් වූ සියළු සත්වයන්ට උත්තම වූ සියල්ල මැනවින් අවබෝධ කළාවු "අනෝමදස්සී" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද උන්වහන්සේ බුදුවීම සදහා පිට දී වදාළ "කුඹුක් " නම් ජය ශ්‍රී මහ බෝධින් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 11 පදුම බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගනධ ධූපෙහි - ගිලාන පචචයෙහිච
පුපඵා දි වතථු ජාතෙහි - සුදෙධහි කපපියෙහිච
අනනත ගුණ සමපනනං - පදුමං ලොක නායකං
සුදධ චිතතපපසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, ලොවට නායක වූ අනන්ත ගුණ සම්පන්න වූ පදුම බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භක්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## පදුම බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

11 සො භගවා පදුමො ඉතිපි සම්මා සම්බුද්ධො
සම්මා සම්බුද්ධො වත සො පදුමො භගවා
තං සම්මා සම්බුද්ධං පදුමං භගවන්තං සරණං ගච්ඡාමි.
තං සම්මා සම්බුද්ධං පදුමං භගවන්තං සිරසා නමාමි.

ඒ පදුම බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ පදුම බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ පදුම බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ පදුම බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

පදුමං නාම සම්බුද්ධං ලොකනාථං ජනුත්තමං
සොණ නාමඤ්ච තං බොධිං නමාමි සිරසාදරං

චම්පෙ පුරෙ භවි මහිද්ධික බොධි සොණං
තස්මිං ඨිතො විජිත මාර මිතො මතී සො
වස්සං සහස්ස ගුණිතං සතමායු තස්ස
පදුමස්ස තස්ස මුනිපාද මහං නමාමි

එම වරනම් කල්පයෙහිදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලොව පහළ වී වදාළ තුන් ලොවට පිහිට වූ සියළු සත්වයන්ට උත්තම වූ සියල්ල මැනවින් අවබෝධ කළාවූ "පදුම"නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සදහා පිට දී වදාළ "මහ මුරුත" නම් ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 12 නාරද බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගන්ධ ධූපෙහි - ගිලාන පච්චයෙහිච
පුප්ඵා දි වත්‍ථු ජාතෙහි - සුද්ධෙහි කප්පියෙහිච
අරහාදී මහා ගුණං - ධාරෙන්තං නාරදං ජිනං
සුද්ධ චිත්තප්පසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, සත්වයන් දමනය කලාවූ අනන්ත ගුණ සම්පන්න වූ නාරද මුනින්ද්‍රයන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

### නාරද බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

12 සො භගවා නාරදො ඉතිපි සම්මා සම්බුද්ධො
සම්මා සම්බුද්ධො වත සො නාරදො භගවා
තං සම්මා සම්බුද්ධං නාරදං භගවන්තං සරණං ගච්ඡාමි.
තං සම්මා සම්බුද්ධං නාරදං භගවන්තං සිරසා නමාමි.

ඒ නාරද බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ නාරද බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ නාරද බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ නාරද බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

සත්තසාරං මහා භික්ඛුඞ්කදං නාරදං ලොක නායකං
සන්තිදං සොණ බොධිං ච නමාමි සිරසාදරං

පුබ්බෙ ච ධඤ්ඤවතියා භවි බොධි සොණං
තස්මිං ඨිතො විජිත මාර මිතො ජිනො සො
වස්සං සහස්ස ගුණිතං නවුතායු තස්ස
තං නාරදස්ස මුනිපාද මහං නමාමි

එම වරනම් කල්පයෙහිදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලොව පහළ වී වදාළ මහත් අභිඥා බලයෙන් යුක්ත වූ සත්වයන්ට උතුම් රත්නයක් වූ තුන් ලොවට නායක වූ "නාරද" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සඳහා පිට දී වදාළ "මහා මුරුත" නම් ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 13 පියුමතුරා බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගන්ධ ධූපෙහි - ගිලාන පච්චයෙහිච
පුප්ඵා දි වත්ථු ජාතෙහි - සුද්ධෙහි කප්පියෙහිච
අනන්ත ගුණ සම්පන්නං - පදුමුත්තර නෙතාරං
සුද්ධ චිත්තප්පසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, සත්වයන් පුදන ලද්දා වූ අනන්ත ගුණ සම්පන්න වූ පදුමුත්තර මුනින්ද්‍රයන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## පියුමතුරා බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

13 සො භගවා පදුමුත්තරො ඉතිපි සම්මා සම්බුද්ධො
සම්මා සම්බුද්ධො වත සො පදුමුත්තරො භගවා
තං සම්මා සම්බුද්ධං පදුමුත්තරං භගවන්තං සරණං ගච්ඡාමි.
තං සම්මා සම්බුද්ධං පදුමුත්තරං භගවන්තං සිරසා නමාමි.

ඒ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ පදුමුත්තර බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

මහා කාරුණිකං නාථං මුනින්දං පදුමුතතරං
බොධිං සරල කල්‍යාණං නමාමි සිරසාදරං

පුබෙබ හංසවතියා භවි සරල බොධිං
තසමිං ඨිතො විජිත මාර මිතො ජිනො සො
වසසං සහසස ගුණිතං සතමායු තසස
පදුමුතතරසස මුනිපාද මහං නමාමි

නැවත බුද්ධ ශූන්‍ය වූ කල්ප අසංඛ්‍යයකින් පසුව සාරනම් කල්පයෙහි දී ලොව පහළ වී වදාළ මහා කරුණා ගුණයෙන් ලෝක සත්වයන්ට පිහිට වී වදාළ "පදුමුත්තර" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සඳහා පිට දී වදාළ "සළල" නම් ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 14 සුමේධ බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගනධ ධූපෙහි - ගිලාන පචචයෙහිච
පුපඵා දි වතථු ජාතෙහි - සුදෙධහි කපපියෙහිච
අනනත ගුණ සමපනනං - සුමෙධං ලොක නායකං
සුදධ චිතතපපසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, ලෝකයට නායක වූ අනන්ත ගුණ සම්පන්න වූ සුමේධ බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## සුමේධ බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

14 සො භගවා සුමෙධො ඉතිපි සමමා සමබුදෙධා
සමමා සමබුදෙධා වත සො සුමෙධො භගවා
තං සමමා සමබුදධං සුමෙධං භගවනතං සරණං ගචඡාමි.
තං සමමා සමබුදධං සුමෙධං භගවනතං සිරසා නමාමි.

ඒ සුමේධ බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සුමේධ බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සුමේධ බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ සුමේධ බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

මහා මතිං මහා තෙජං සුමෙධං නාම නායකං
නීප බොධිංච කලයාණං නමාමි සිරසාදරං

පුබෙබ සුදසසන පුරෙ භවි නීපබොධිං
තසමිං ධීතො විජිත මාර මිතො යසො සො
වසසං සහසස ගුණිතං නවුතායු තසස
සුමෙධ තසස මුනිපාද මහං නමාමි

නැවත බුද්ධ ශූන්‍ය වූ කල්ප හැත්තෑ දහසකින් පසුව මණ්ඩ නම් කල්පයෙහිදී ලොව පහළ වී වදාළ මනා සිහියෙන් හා නුවණින් යුක්ත වූ මහත් තේජස් ඇත්තා වූ තුන් ලොවට නායක වූ "සුමේධ" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සඳහා පිට දී වදාළ "බක්මී" නම් ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 15 සුජාත බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගන්ධ ධූපෙහි - ගිලාන පච්චයෙහිච
පුප්ඵා දි වත්‍ථු ජාතෙහි - සුද්ධෙහි කප්පියෙහිච
අනන්ත ගුණ සම්පන්නං - සුජාතං ලොක පූජිතං
සුද්ධ චිත්තප්පසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, ලෝකයා විසින් පුදන ලද්දා වූ අනන්ත ගුණ සම්පන්න වූ සුජාත බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

## සුජාත බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

15 සො භගවා සුජාතො ඉතිපි සම්මා සම්බුද්ධො
සම්මා සම්බුද්ධො වත සො සුජාතො භගවා
තං සම්මා සම්බුද්ධං සුජාතං භගවන්තං සරණං ගච්ඡාමි.
තං සම්මා සම්බුද්ධං සුජාතං භගවන්තං සිරසා නමාමි.

ඒ සුජාත බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සුජාත බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සුජාත බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ සුජාත බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

සුජාතං සබ්බ ලොකග්ගං චක්ඛු මන්තං මහා මුනිං
වෙළු බොධිංච කල්‍යාණං නමාමි සිරසාදරං

පුබ්බෙ සුමංගල පුරෙ භවි වෙණුබොධිං
තස්මිං ඨිතො විජිත මාර මනන්ත ඤාණො
වස්සං සහස්ස ගුණිතං නවුතායු තස්ස
සුජාතස්ස මුනිපාද මහං නමාමි

එම මණ්ඩ නම් කල්පයෙහිදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලොව පහල වී වදාළ පසැස් ඇත්තා වූ සියලූ ලෝකවාසීන්ට අග්‍ර වූ "සුජාත" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සඳහා පිට දී වදාළ "හුණ තුරු" නම් ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 16 පියදස්සි බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගනධ ධූපෙහි - ගිලාන පචචයෙහිච
පුපඵා දි වතථු ජාතෙහි - සුදෙධහි කපපියෙහිච
අනනත ගුණ සමපනනං - පියදසසිං නරාසභං
සුදධ චිතතපපසාදෙන - භතත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! භාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, දෙව් මිනිසුන්ට ශ්‍රේෂ්ඨ වූ අනන්ත ගුණ සම්පන්න වූ පියදස්සි බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## පියදස්සි බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

16 සො භගවා පියදසසී ඉතිපි සමමා සමබුදෙධා
සමමා සමබුදෙධා වත සො පියදසසී භගවා
තං සමමා සමබුදධං පියදසසිං භගවනතං සරණං ගචඡාමි
තං සමමා සමබුදධං පියදසසිං භගවනතං සිරසා නමාමි.

16. වන්දනාවේ තේරුම

ඒ පියදස්සි බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ පියදස්සි බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ පියදස්සි බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ පියදස්සි බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

අංගීරසං ජුතී මනතං පියදසසිං නරා සභං
සෙටඨං පියංගු බොධිංච නමාමි සිරසාදරං

පුබෙබ සුධඤ්ඤ නගරෙ කකුධොසි බොධිං
තසමිං ඨිතො විජිත මාර මනනත පුඤ්ඤ
වසසං සහසස ගුණිතං නවුතායු තසස
පියදසසි තසස මුනිපාද මහං නමාමි

නැවත බුද්ධ ශූන්‍ය වූ කල්ප විසි නව දහස් අටසිය දෙඅසුවකින් පසුව වර නම් කල්පයෙහිදීම ලොව පහළ වී වදාළ ප්‍රඥා ලෝකයෙන් බබළන්නා වූ දෙව් මිනිසුන්ට ශ්‍රේෂ්ඨ වූ "අංගීරස පියදස්සී" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සඳහා පිට දී වදාළ "පුවඟු" නම් ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 17 අත්ථදස්සී බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගනධ ධූපෙහි - ගිලාන පචචයෙහිච
පුපඵා දි වත්‍ථු ජාතෙහි - සුදෙධහි කපපියෙහිච
අනනත ගුණ සමපනනං - අත්‍ථදසසිං විනායකං
සුදධ චිතතපපසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, සත්වයන් මනාකොට හික්මන ලද්දා වූ අනන්ත ගුණ සම්පන්න වූ අත්‍ථදස්සී බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## අත්ථදස්සි බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

17 සො භගවා අත්ථදස්සී ඉතිපි සම්මා සම්බුද්ධො
සම්මා සම්බුද්ධො වත සො අත්ථදස්සී භගවා
තං සම්මා සම්බුද්ධං අත්ථදස්සිං භගවන්තං සරණං ගච්ඡාමි
තං සම්මා සම්බුද්ධං අත්ථදස්සිං භගවන්තං සිරසා නමාමි.

ඒ අත්ථදස්සි බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ අත්ථදස්සි බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ අත්ථදස්සි බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ අත්ථදස්සි බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

අත්ථදස්සිං කාරුණිකං මහෙසිං ජින පුංගවං
චම්පකං නාම තං බොධිං නමාමි සිරසාදරං

පුබ්බෙ ච සොභන පුරෙ භවි චම්ප බොධිං
තස්මිං ඨිතො විජිත මාර මනන්ත තෙජො
වස්සං සහස්ස ගුණිතං සතමායු තස්ස
තං අත්ථදස්සි මුනිපාද මහං නමාමි

එම වර නම් කල්පයෙහිදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලොව පහළ වී වදාළ මහත් කාරුණික ගුණයෙන් යුක්ත වූ සියලූ සෑෂින්ට නායක වූ මහත් යසස් ඇති "අත්ථදස්සි" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සදහා පිට දී වදාළ "සපු" නම් ජය ශ්‍රී මහ බෝධින් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 18 ධම්මදස්සි බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගන්ධ ධූපෙහි - ගිලාන පච්චයෙහිච
පුප්ඵා දි වත්ථු ජාතෙහි - සුද්ධෙහි කප්පියෙහිච
අනන්ත ගුණ සම්පන්නං - ධම්මදස්සිං ජනුත්තමං
සුද්ධ චිත්තප්පසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, පස්මරුන් දිනූ උත්තම වූ අනන්ත ගුණ සම්පන්න වූ ධම්මදස්සි බුදුරජාණන් වහන්සේට භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

## ධම්මදස්සි බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

18 සො භගවා ධම්මදස්සී ඉතිපි සම්මා සම්බුද්ධො
සම්මා සම්බුද්ධො වත සො ධම්මදස්සී භගවා
තං සම්මා සම්බුද්ධං ධම්මදස්සිං භගවන්තං සරණං ගච්ඡාමි
තං සම්මා සම්බුද්ධං ධම්මදස්සිං භගවන්තං සිරසා නමාමි.

ඒ ධම්මදස්සි බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ ධම්මදස්සි බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ ධම්මදස්සි බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ ධම්මදස්සි බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා
!

සාධු ! සාධු !! සාධු !!!

බ්‍රහ්මාති බ්‍රහ්ම පවරං ධම්මදස්සිං තමොනුදං
කදම්බං නාම තං බොධිං නමාමි සිරසාදරං

පුබ්බෙ සීති සරණං බොධිං බිම්බිජාලකං
තස්මිං ඨිතො විජිත මාර මනන්ත තෙජො
වස්සං සහස්ස ගුණිතං සතමායු තස්ස
තං ධම්මදස්සි මුනිපාද මහං නමාමි

එම වර නම් කල්පයෙහිදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලොව පහළ වී වදාළ මොහඳුරට ළහිරු මඩලක් බඳු වූ බ්‍රහ්මාති බ්‍රහ්ම ශ්‍රේෂ්ඨ ගුණයෙන් යුක්ත වූ "ධම්මදස්සි" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සදහා පිට දී වදාළ "කොලොම්තුර" නම් ජය ශ්‍රී මහ බෝධින් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 19 සිද්ධත්ථ බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගන්ධ ධූපෙහි - ගිලාන පච්චයෙහිච
පුප්ඵා දි වත්ථු ජාතෙහි - සුද්ධෙහි කප්පියෙහිච
අනන්ත ගුණ සම්පන්නං - සිද්ධත්ථං අසමං ජිනං
සුද්ධ චිත්තප්පසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, පස්මරුන් දිනූ අසමසම අනන්ත ගුණ සම්පන්න වූ සිද්ධත්ථ බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## සිද්ධත්ථ බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

19 සො භගවා සිද්ධත්ථො ඉතිපි සම්මා සම්බුද්ධො
සම්මා සම්බුද්ධො වත සො සිද්ධත්ථො භගවා
තං සම්මා සම්බුද්ධං සිද්ධත්ථං භගවන්තං සරණං ගච්ඡාමි
තං සම්මා සම්බුද්ධං සිද්ධත්ථං භගවන්තං සිරසා නමාමි.

ඒ සිද්ධත්ථ බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සිද්ධත්ථ බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සිද්ධත්ථ බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ සිද්ධත්ථ බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

සිද්ධත්ථං පටි විද්ධන්තං සබ්බ ලොකෙක නායකං
තස්ස බොධිංච කණිකාරං නමාමි සිරසාදරං

වෙභාර නාම නගරෙ කණිකාර බොධිං
තස්මිං ඨිතො විජිත මාර මිතො ගුණො සො
වස්සං සහස්ස ගුණිතං සතමායු තස්ස
සිද්ධත්ථ තස්ස මුනිපාද මහං නමාමි

නැවත බුද්ධ ශුන්‍ය වූ විසි හතර කල්පයකින් පසුව සාර නම් කල්පයෙහිදී ලොව පහල වී වදාළ තුන් ලෝක ධාතුවට අසහාය නායක වූ ප්‍රතිවේධ කළ යුතු සකල ධර්මයන් මනා කොට ප්‍රතිවේධ කළා වූ "සිද්ධාර්ථ" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සඳහා පිට දී වදාළ "කිණිහිරි" නම් ජය ශ්‍රී මහ බෝධින් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 20 තිස්ස බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගන්ධ ධූපෙහි - ගිලාන පච්චයෙහිච
පුපඵා දි වත්‍ථු ජාතෙහි - සුදෙධහි කපපියෙහිච
අනනත ගුණ සමපනනං - තිසසං ලොකෙක නායකං
සුදධ චිතතපපසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, තුන්ලොවට නායක වූ අනන්ත ගුණ සම්පන්න වූ තිස්ස බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## තිස්ස බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

20 සො භගවා තිසෙසා ඉතිපි සමමා සමබුදෙධා
සමමා සමබුදෙධා වත සො තිසෙසා භගවා
තං සමමා සමබුදධං තිසසං භගවනතං සරණං ගචඡාමි
තං සමමා සමබුදධං තිසසං භගවනතං සිරසා නමාමි.

ඒ තිස්ස බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ තිස්ස බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ තිස්ස බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ තිස්ස බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

සත්ථාරං තිස්ස සම්බුද්ධං සබ්බඤ්ඤුං ලොක පූජිතං
අසනං නාම තං බොධිං නමාමි සිරසාදරං

පුබ්බෙ ච ඛෙමක පුරෙ අසනඤ්ච බොධිං
තස්මිං ඨිතො විජිත මාර මිතො ජුතී සො
වස්සං සහස්ස ගුණිතං සතමායු තස්ස
තිස්සස්ස තස්ස මුනිපාද මහං නමාමි

නැවත බුද්ධ ශූන්‍ය වූ එක් කල්පයක් ගිය තැන මණ්ඩ නම් කල්පයෙහිදී ලොව පහල වී වදාල සියලු ලෝක වාසීන් විසින් පුදනු ලද්දාවූ සියලූ ධර්මයන් මැනවින් අවබෝධ කළාවූ විනෙය ජනයා මනාකොට හික්මවන ලද්දා වූ "තිස්ස" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සඳහා පිට දී වදාළ "පියාල" නම් ජය ශ්‍රී මහ බෝධින් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 21 ඵුස්ස බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගන්ධ ධූපෙහි - ගිලාන පච්චයෙහිච
පුප්ඵා දි වත්ථු ජාතෙහි - සුද්ධෙහි කප්පියෙහිච
අනන්ත ගුණ සම්පන්නං - ඵුස්සංව්හයං ජිනං වරං
සුද්ධ චිත්තප්පසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, පස්මරුන් දිනූ සත්වයන්ගේ පුද වරං ලැබූ අනන්ත ගුණ සම්පන්න වූ ඵුස්ස බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

## ඵුස්ස බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

21 සො භගවා ඵුසෙසා ඉතිපි සමමා සමබුදෙධා
සමමා සමබුදෙධා වත සො ඵුසෙසා භගවා
තං සමමා සමබුදධං ඵුසසං භගවනතං සරණං ගචඡාමි
තං සමමා සමබුදධං ඵුසසං භගවනතං සිරසා නමාමි

ඒ ඵුස්ස බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ ඵුස්ස බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ ඵුස්ස බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ ඵුස්ස බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

මුනිනදං ඵුසස සමබුදධං මහිදධිං සුගුණාකරං
ආමලකං තසස බොධිං නමාමි සිරසාදරං

කාසී පුරෙ අහවි ආමලකොති බොධිං
තසමිං ධීතො විජිත මාර මිතො මතී සො
වසසං සහසස ගුණිතං නවුතායු තසස
ඵුසසසස තසස මුනිපාද මහං නමාමි

එම මණ්ඩ නම් කල්පයෙහිදී නැවත බුද්ධාන්තරයකින් පසුව ලොව පහළ වී වදාළ සියලු ගුණයන්ට ආකරයක් බඳු වූ මහත් සෘද්ධි බල ඇත්තා වූ ස්වයම්භූ ඥාණයෙන් සත්‍ය ධර්මයන් අවබෝධ කළා වූ "ඵුස්ස" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සඳහා පිට දී වදාළ "ආමලක" නම් ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 22 විපස්සි බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගනධ ධූපෙහි - ගිලාන පචචයෙහිච
පුපඵා දි වතථු ජාතෙහි - සුදෙධහි කපපියෙහිච
අනනත ගුණ සමපනනං - විපසසිං ච විනායකං
සුදධ චිතතපපසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, ලෝක සත්වයා හික්ම වූවා වූ අනන්ත ගුණ සම්පන්න වූ විපස්සි බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## විපස්සි බුදුරජාණන් වහන්සේ වන්‍දනා ගාථා

22 සො භගවා විපසසි ඉතිපි සමමා සමබුදෙධා
සමමා සමබුදෙධා වත සො විපසසි භගවා
තං සමමා සමබුදධං විපසසිං භගවනතං සරණං ගචඡාමි
තං සමමා සමබුදධං විපසසිං භගවනතං සිරසා නමාමි.

ඒ විපස්සි බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ විපස්සි බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ විපස්සි බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ විපස්සි බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

විජජාචරණ සමපනනං විපසසිං විගතොපමං
පාඨලිංච මහා බොධිං නමාමි සිරසාදරං

විපසසි නාථං චතුසචච දසසිං
විසුදධ චිතතං තිභවෙක කෙතුං
සමනත සංකෙලස නුදං උදරං
සුබතථිකො තං පණමෙ සදහං

නැවත බුද්ධ ශුන්‍ය වූ එක් කල්පයක් ගිය තැන සාර නම් කල්පයෙහිදී ලොව පහල වී වදාල අෂ්ඨ විද්‍යා පසළොස්චරණ ධර්මයන් ගෙන් යුක්ත වූ ප්‍රමාණාතික්‍රාන්ත වූ රූපකාය සම්පත්තියෙන් හා ධර්මකාය සම්පත්තියෙන් යුක්ත වූ "විපස්සි" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සඳහා පිට දී වදාළ "පලොල්" නම් ජය ශ්‍රී මහ බෝධින් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 23 සිඛී බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගනධ ධූපෙහි - ගිලාන පචචයෙහිච
පුපඵා දි වතථු ජාතෙහි - සුදෙධහි කපපියෙහිච
අනනත ගුණ සමපනනං - සිඛිං ලොක හිතං ජිනං
සුදධ චිතතපපසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, පස්මරුන් දිනූ ලෝකයාට හිතකර වූ අනන්ත ගුණ සම්පන්න වූ ඒ සිඛී බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

## සිඛී බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

23 සො භගවා සිඛී ඉතිපි සමමා සමබුදෙධා
සමමා සමබුදෙධා වත සො සිඛී භගවා
තං සමමා සමබුදධං සිඛීං භගවනතං සරණං ගචඡාමි
තං සමමා සමබුදධං සිඛීං භගවනතං සිරසා නමාමී

ඒ සිඛී බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සිඛී බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සිඛී බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ සිඛී බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

සිඛී නාමං මහා විරං මහෙසිං ජින පුංගවං
පුංඩරිකංච තං බොධිං නමාමි සිරසාදරං

සිද්ධංසිඛි සඞ්ඛඞ්ඛ මනොම පඞ්ඛඞ්ඛං
දෙවාති දෙවං යතිනාථ භූතං
සනතාරිතාවිං ජනතං භවණ්ණවා
වන්දමි තං ලොකගරුං මුදහං

නැවත බුද්ධ ශූන්‍ය වූ සැට කල්පයකින් පසුව මණ්ඩ නම් කල්පයෙහිදී ලොව පහල වී වදාල දිනන ලද ඉඳුරන් ඇත්තා වූ ද මහත් සෘෂි සමූහයා විසින් පෙරටු කොට ගත්තා වූ ද මහත් වීර්යය පරාක්‍රමයකින් යුක්ත වූ "සිඛී" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සඳහා පිට දී වදාළ "ඇටඹ" නම් ජය ශ්‍රී මහ බෝධින් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 24 වෙස්සභූ බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගනධ ධූපෙහි - ගිලාන පචචයෙහිච
පුපඵා දි වතථු ජාතෙහි - සුදෙධහි කපපියෙහිච
අනනත ගුණ සමපනනං - වෙසසභුං ලොක නායකං
සුදධ චිතතපපසාදෙන - භතයාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, ලොවට නායක වූ අනන්ත ගුණ සම්පන්න වූ වෙස්සභූ බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## වෙස්සභූ බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

24 සො භගවා වෙසසභූ ඉතිපි සමමා සමබුදෙධා
සමමා සමබුදෙධා වත සො වෙසසභූ භගවා
තං සමමා සමබුද්ධං වෙසසභුං භගවනතං සරණං ගචඡාමි
තං සමමා සමබුද්ධං වෙසසභුං භගවනතං සිරසා නමාමි.

ඒ වෙස්සභූ බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ වෙස්සභූ බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ වෙස්සභූ බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ වෙස්සභූ බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

ලොක විදුං ලොක නාථං වෙසසභුං සුඛ දායකං
සාල බොධිංච කලයාණං නමාමි සිරසාදරං

රතතින්දිවංදෙහ පභාව භාසං
සන්දලිතං නෙක කිලෙස ජාලං
ලොකාතිගං නිචච ජනානු කමපිං
වන්දෙ මුදහං මුනිවෙසසභුං තං

එම මණ්ඩ නම් කල්පයෙහිදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලොව පහල වී වදාල සකල ලෝකය අතැඹුලක් සේ මැනවින් දැන වදාලා වූ සියලු ලෝ වැසියන්ට අසහාය පිහිටක් වූ දෙව් මිනිසුන්ට ස්වර්ග සම්පත් සලසා දුන්නා වු "වෙස්සභූ" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සදහා පිට දී වදාළ "සාල කලයාණ" නම් ජය ශ්‍රී මහ බෝධින් වහන්සේටද, මම නමස්කාර කරමි. නමස්කාර වේවා ! මෙම සියළු පූජාවෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 25 කකුසඳ බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගන්ධ ධූපෙහි - ගිලාන පච්චයෙහිච
පුප්ඵා දි වත්ථු ජාතෙහි - සුද්ධෙහි කප්පියෙහිච
අනන්ත ගුණ සම්පන්නං - කකුසන්ධං මහා මුනිං
සුද්ධ චිත්තප්පසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, මහා මුනීන්ද්‍ර වූ අනන්ත ගුණ සම්පන්න වූ කකුසඳ බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## කකුසඳ බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

25 සො භගවා කකුසන්ධො ඉතිපි සම්මා සම්බුද්ධො
සම්මා සම්බුද්ධො වත සො කකුසන්ධො භගවා
තං සම්මා සම්බුද්ධං කකුසන්ධං භගවන්තං සරණං ගච්ඡාමි
තං සම්මා සම්බුද්ධං කකුසන්ධං භගවන්තං සිරසා නමාමි.

ඒ කකුසඳ බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ කකුසඳ බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ කකුසඳ බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ කකුසඳ බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

කකුසන්ධං සත්ථ වාහං මුනින්දං සුසමාහිතං
සිරීසං නාම තං බොධිං නමාමි සිරසාදරං

පඨමෙව අස්මිං වරභද්ද කප්පෙ
දීපදුත්තමත්තං සමුපාගතො යො
අමතංදදං තං කකුසන්ධ නාථං
පමුද්ව වන්දෙ වර සන්ති කාමො

නැවත බුද්ධ ශූන්‍ය වූ තිස් එක් කල්පයකින් පසුව මේ මහා භද්‍ර කල්පයෙහි ප්‍රථම අනතඃකල්පයෙහිදීම ලොව පහල වී වදාල දමනය කරන ලද ඉඳුරන් ඇත්තා වූ මාර්ග දේශකත්වයෙන් සත්ථාවාහක නම් වූ "කකුසඳ" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සදහා පිට දී වදාළ "මහරී" නම් ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 26 කෝණාගමණ බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගනධ ධූපෙහි - ගිලාන පචචයෙහිච
පුපඵා දි වතථු ජාතෙහි - සුදෙධහි කපපියෙහිච
අනනත ගුණ සමපනනං - කොණාගමන සමබුදධං
සුදධ චිතතපපසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, සම්මා සම්බුද්ධාදී ගුණයෙන් අනන්ත ගුණ සම්පන්න වූ කොණාගමණ බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## කෝණාගමණ බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

26 සො භගවා කොණාගමණො ඉතිපි සමමා සමබුදෙධා
සමමා සමබුදෙධා වත සො කොණාගමණො භගවා
තං සමමා සමබුදධං කෝණාගමණං භගවනතං සරණං ගචඡාමි
තං සමමා සමබුදධං කොණගමණං භගවනතං සිරසා නමාමි

ඒ කෝණාගමණ බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ කෝණාගමණ බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ කෝණාගමණ බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ කෝණාගමණ බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

මහෙසිං කොණාගමණං බුද්ධං දස විලොචනං
උදුම්බරංච තං බොධිං නමාමි සිරසාදරං

භවණ්ණවා නිත්ථරණෙ ජනානං
සුපාතු භූතං තරණී සමානං
භවන්තගුං ලොක හිතං මුනින්දං
නමාමි කොණාගම නාභිධානං

නැවත බුද්ධාන්තරයකින් පසුව මේ මහා භද්‍ර කල්පයෙ දෙවන අන්තඃකල්පයෙහිදී ලොව පහල වී වදාල සකල ධර්මයන් මනාව අවබෝධ කලා වු නොපැකිල දක්නා වූ අනාවරණ ඥාණයෙන් සමන්නාගත වූ "කෝණාගමන" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සඳහා පිට දී වදාළ "දිඹුල්" නම් ජය ශ්‍රී මහ බෝධින් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 27 කස්සප බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගන්ධ ධූපෙහි - ගිලාන පච්චයෙහිච
පුප්ඵා දි වත්ථු ජාතෙහි - සුද්ධෙහි කප්පියෙහිච
අනන්ත ගුණ සම්පන්නං - කස්සපං ජින පුංගවං
සුද්ධ චිත්තප්පසාදෙන - භත්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, පස්මරුන් දිනූ මහත් යසස් ඇති අනන්ත ගුණ සම්පන්න වූ කස්සප බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## කස්සප බුදුරජාණන් වහන්සේ වන්‍දනා ගාථා

27 සො භගවා කසසපො ඉතිපි සමමා සමබුදෙධා
සමමා සමබුදෙධා වත සො කසසපො භගවා
තං සමමා සමබුද්ධං කසසපං භගවනතං සරණං ගචඡාමි
තං සමමා සමබුද්ධං කසසපං භගවනතං සිරසා නමාමි.

ඒ කස්සප බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ කස්සප බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ කස්සප බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ කස්සප බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

කසසපං නාම සමබුද්ධං මාරාරිං රිපු සුතතමං
නිග්‍රොධංච තං බොධිං නමාමි සිරසාදරං

වෙනෙය්‍ය ජනතු කමලාකර බොධනාරිං
සදධමම රංසි නිකාරාකර රංසිමාලිං
ලොකුතතරාමත ගුණොදය ඤාණසාලිං
වන්‍දාමි කසසප සමවහය සනති නාථං

නැවත බුද්ධාන්තරයකින් පසුව මේ මහා භද්‍ර කල්පයෙහි තෙවන අන්තඃකල්පයෙහිදී ලොව පහල වී වදාල සියලු කෙලෙස් සතුරන් නැසුවා වූද, මනා කොට පස්මරුන් පරදවන ලද්දා වූද, සියලු සත්වයන්ට උත්තම වූද "කස්සප" නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් ලොව පහල වී වදාළ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සඳහා පිට දී වදාළ "නුග" නම් ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 28 ගෞතම බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

දීපෙහි ගනධ ධූපෙහි - ගිලාන පචචයෙහිච
පුපඵා දි වතථු ජාතෙහි - සුදෙධහි කපපියෙහිච
අනනත ගුණ සමපනනං - ගොතමං ලොක නායකං
සුදධ චිතතපපසාදෙන - භත‍්‍යාදරෙන පූජයෙ

ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, ලෝකයට නායක වූ අනන්ත ගුණ සම්පන්න වූ ගෞතම බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න වූ සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

### ගෞතම බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථා

28 සො භගවා ගොතමො ඉතිපි සමමා සමබුදෙධා
සමමා සමබුදෙධා වත සො ගොතමො භගවා
තං සමමා සමබුදධං ගොතමං භගවනතං සරණං ගචඡාමි
තං සමමා සමබුදධං ගොතමං භගවනතං සිරසා නමාමි.

ඒ ගෞතම බුදුරජාණන් වහන්සේ මෙසේ ද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ ගෞතම බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ ගෞතම බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ ගෞතම බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

අංගීරසං භූරිපඤ්ඤං ගොතමං සක්‍ය පුංගවං
අසසතථංච මහා බොධිං නමාමි සිරසාදරං

යාවජජ දිපපති සුභං භුවනතත යසමිං
යසසානු සාසන වරංවිපුලතථ කාරිං
සමපුත කිතති විසරං ජනසෙවනියං
තං ගොතමං නධි වරං සතතං නමාමි

නැවත බුද්ධාන්තරයකින් පසුව මේ මහා භද්‍ර කල්පයෙහි සතරවන අන්තඃකල්පයෙහිදී ලොව පහල වී වදාළ මහා ප්‍රාඥවූ ශාක්‍ය පුත්‍රයන් පිරිවරා ගත්තා වූ ලෝක සත්වයාට එකම පිහිටක් වූ "ගෞතම" නම් ගොත්‍ර නාමයෙන් ජනාදරයට පත් වූ අප සිද්ධාර්ථ ගෞතම බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සඳහා පිට දී වදාළ "අස්සත්ථ" නම් ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## අතිපූජනීය මහා කම්මට්ඨානාචරිය නා උයනේ අරියධම්ම ස්වාමීන්වහන්සේට වන්දනා ගාථා

යොගස්සමාධි පති සො අනුසාසකො හො
බුද්ධඞ්කුරො අරියධම්ම යතින්දනාථො
සන්තො ච සො දමිතචිත්ත සදූපදෙසො
දීඝායු හොතු ! රතනත්තය ආනුභාවා

යෝගාශ්‍රම පිංකෙතෙ අධිපතිව, අනුශාසකව
බෝසත් ගුණ සපිරි අරියදම් යති උත්තමාණෙනි !
සත් බවින් සත් උපදේසක දැමුණු සිත් ඇති උත්තමාණෙනි
තුන් රත්නයේ අනුහසින් ලබත්වා දිගාසිරි

ලංකාය සාසන නභුග්ගත ඔසධී ච
ගම්භීර ධම්ම කිරණෙන සදා සමිද්ධි
සංසුද්ධ සීලගුණ භූසන භූසිතොසො
දීඝායුකෝ අරියධම්ම ගුරුත්තමො මෙ

ලක් සසුන් ගගන තලේ ඕසධී තාරකාවක් බඳු වූ
ගැඹුරු දම් රැසින් සදා සමෘද්ධිමත් වුණු
සුපිරිසිදු සිල්ගුණ පළඳනාව පැළඳගත්
මගේ ගුරු උත්තමාණෙනි අරියධම්ම
සමිඳුණනි ! ලබත්වා දිගාසිරි !

සම්බුද්ධ සාසන චිරට්ඨිතිමිච්ඡමානො
සන්තො තපො ගුණධනො කථිකො සධම්මෙ
සො බොධිසත්ත ඉති විස්සුත කිත්ති ඝොසො
ථෙරුත්තමො ස’ගරුමෙ ජයතං චිරස්සං

සම්බුදු සසුන් කෙත දිගුකල් සිතන ඔබ
සත්සිල් ගුණ දන සදහම් කථික ඔබ
බුද්ධංකුරයෙකු යැයි පැතිරුණු කිත් හඬැති
උත්තම ගුරු උත්තමාණෙනි ථෙරපාදයාණෙනි !
ජය ලබත්වා බොහෝ කල් !

සංඝිස්සරොච පවරො භවි ගණ්ඨකාරො
සතථාගමෙ සුනිපුණො මන භාවිතත්තො
පුඤ්ඤිද්ධිකො අරිය සත්ත ධනෙ මහිද්ධි
සම්බොධි ඤාණ මධිගච්ඡතු සංඝ සීහො

සඟනට අධිපති - උතුම් ගත්කතුවෙකි
පිටකයෙහි නිපුණෑති - සුභාවිත සිත් ඇති
පිං බල මහිම - අරියධනෙහි මහත් බල
සඟනට අභීත - සීහරාජ බවපෙන්වන
නා සමිඳු දකිත්වා සම්බුදු නැණ

ධම්මේන නේන මතිසිද්ධ මුදාචිතේන
බුද්ධා දී වත්ථු ගත ධම්ම බලේන සද්ධිං
ථෙරාසභො අරියධම්ම යතින්ද නාථො
දීඝායුකෝ භවතු සාධු සමිද්ධ චිත්තෝ

දැහැමින් සෙමින් රැස්කල කුසල් බලයෙන් හා
බුද්ධාදී රත්නයන් කෙරෙහි චිත්ත ප්‍රසාදයෙන්
ථෙරාසභ අරියධම්ම යතින්ද්‍රයාණන් වහන්සේ
ලබත්වා දිගාසිරි සාධු සාධු ලබත්වා !

(පිටු අංක 67-68 දිගන සුගතවංශ ස්වාමීන්වහන්සේ විසින් නිර්මාණය කරනලද ගාථා පෙළහරක් වේ. පිටු අංක 69-70 අරියමග්ග සංවිධානයේ ප්‍රකාශනයකි.)

# අපගේ ඒකායන ප්‍රාර්ථනය

දසත පැතිර පවත්නා වූ ගුණ කීර්තියක් ඇති, සියළු පාප ධර්මයන් මැනවින් ප්‍රහානය කළා වූ තුන් ලෝක වාසීන්ට අසහාය පිහිටක් වූ, මහත් ගුණ සමුදායකින් හා ඥාණ සම්පත්තියකින් යුක්ත වූ දෙතිසක් මහා පුරුෂ ලක්‍ෂණයන්ගෙන් බබළන්නා වූ, අසූවක් අනු ව්‍යංජන ලක්‍ෂණයන්ගෙන් සෝභමාන වූ එකසිය අටක් බැගින් චක්‍ර ලක්ක්‍ෂණයන්ගෙන් හා දෙසීය සොළොසක් මංගල ලක්‍ෂණයන්ගෙන් විරාජමාන වූ, සූවිසිකෙළ ලක්ෂ වාරයක් අර්හත් ඵල සමාපත්ති සංඛ්‍යාත වජිරඥාණයන්ගෙන් සමන්නාගත වූ දේවාති දේව වූ ශක්‍රාති ශක්‍ර වූ, බ්‍රහ්මාති බ්‍රහ්ම වූ, සමන්ත භද්‍ර වූ, 512000 අධික සර්වඥ සම්බුද්ධරාජෝත්තමයාණන් වහන්සේලා විසි අසංඛ්‍ය කල්පලක්‍ෂය තුල මේතාක් ලොව පහලව ඇත.

මස් ලේ දියවී ගියත් සම් නහර ඇට කටු ශේෂ වෙතත් උතුම් වූ සර්වඥතා ඥානය අවබෝධ කොටගෙන මිසක මෙම ආසනයෙන් නොනැගිටිමියි අධිෂ්ඨාන කොට වජිරාසනාරූඪව දස දහසක් ලෝක ධාතුව කම්පාකරවමින් ලොව පහළ වූ සර්වඥ සම්බුද්ධ රාජෝත්තමයාණන් වහන්සේලාගේ අනන්ත අප්‍රමාණ නව අරහාදී බුදුගුණ බලයෙන්ද, මහා කරුණාගුණ බලයෙන්ද, අනන්ත අප්‍රමාණ ප්‍රඥාගුණ බලයෙන්ද, අසීමිත සීලස්කන්ධයේ ගුණ බලයෙන්ද, අසමසම බුද්ධගුණානුභාව බලයෙන්ද, සාරා සංඛෙය්‍ය කල්ප ලක්‍ෂයක් පාරමීදම් පුරමින් ලොවුතුරා සම්මා සම්බුද්ධත්වයට පත්වූ අපගේ තථාගත සම්මා සම්බුදුපියාණන් වහන්සේගේ අනන්ත අප්‍රමාණ ප්‍රඥාගුණ බලයෙන්ද මහා කරුණා ගුණ බලයෙන්ද, නව අරහාදී බුදුගුණ බලයෙන්ද, අසීමිත සීලස්කන්ධයේ ගුණ බලයෙන්ද, ඒ අසීමිත අසමසම බුද්ධගුණානුභාව බලයෙන්ද,

ද්‍රෝණයක් පමණ වූ සර්වඥ ධාතූන් වහන්සේ නිර්මිත වූ බුදුරුවක් තුල බුදුරැස් විහිදුවමින් වැඩ සිටින්නා වූ ඒ මහාර්ඝ වූ රුවන්මැලි චෛත්‍ය රාජයාණන් වහන්සේ අභියස සිට තණ්හංකර බුදුරජාණන්වහන්සේ සිට අපගේ ගෞතම සම්මා සම්බුදුරජාණන්වහන්සේ දක්වා 28 නමක් වූ ශ්‍රී සම්බුදු රජාණන්වහන්සේලා ජීවමානව අප ඉදිරියේ වැඩ සිටිතැයි අරමුණු කරමින් ඒ භාග්‍යවතුන් වහන්සේලාගේ අසීමිත ගුණස්කන්ධය වන්දනා කරමින් බුද්ධ ප්‍රතිමා වහන්සේ, මල් ආසන, මුතු කුඩ ආවරණ, අටපිරිකර, අනිකුත් පිරිකර, අෂ්ඨපාන ගිලන්පස දැහැත්, බෙහෙත් ඖෂධ වට්ටි, ඖෂධ ගිලන්පස පූජාව, මල් වෙහෙර, මල් බන්දේසි, මල් බඳුන්, මල් මාලා, මල් කොඩි, සහ වෙනත් මල් පූජාවෝ කොත් කැරැල්ලේ සිට පේසා වළලු දක්වා බෞද්ධ කොඩියක් ලෙස පවත්වනු ලබන සුවිශේෂ ආලෝක පූජාව,

බුදුරජාණන් වහන්සේලා වන්දනා කොඩි, නමස්කාර පාඨ කොඩි, ධම්මපද ගාථා කොඩි සහ වෙනත් කොඩි, ඉටිපන්දම් පහන්, කොප්පරා පහන්, වෙසක් කූඩු, නෙළුම් මල් කූඩු, සුවඳ පොට්ටනි පහන්, සුවඳ දුම් කිරි ආහාර පූජාව මහා දානමය, සංඝෝපස්ථාන පිංකම්, ඉතිහාස පුවරු අවට භූමිය සැකසීම සහ ආලෝකවත් කිරීම, අටවිසි බුදුරජාණන් වහන්සේලා වන්දනාව, සර්ව රාත්‍රික ධම්මපද සජ්ඣායනාව, තෙසැත්තෑ ඥාණ වන්දනාව සහ ධර්ම ග්‍රන්ථ පූජාව ධර්මදේශනා ඇතුලත් සංයුක්ත තැටි, හේවිසි, දන්සැල්, බෝධීන් වහන්සේ රෝපණය, මහ සෑ මළුව සුවඳ පැණින් නැහැවීම පිරිත් සජ්ඣායනා ආදී අසිරිමත් පූජාවන්ගෙන් සහ මාස ගණනක් මුළුල්ලේ ගරු කටයුතු මහ සංඝ රත්නය සහ සැදැහැවතුන් විවිධාකාරයෙන් සම්බන්ධවෙමින් සිදුකරනු ලද්දා වූ අසිරිමත් ප්‍රතිපත්ති පූජාවන්ගේ ආනුභාවයෙන්ද,

බෝධිසත්ව ගුණෝපේත ලක්සසුන් ගගන තලයෙහි ඕසධී තාරකාවක් බදුවූ මාර්තු 27 වන දින පැවිදි දිවියේ 52 වසරක්ද අප්‍රේල් 24 වන දින 70 වැනි ජන්ම දිනය පිරුවා වූද අතිපූජනීය මහා කම්මට්ඨානාචරිය නා උයනේ අරියධම්ම ස්වාමිපාදෝත්තමයාණන් වහන්සේට සුවසේම පාරමීදම් සපුරා දෙතිසක් මංගල්‍ය පූර්ව නිමිතිවලින් මුලු ලෝකධාතුව සැරසී ඇතිවිට දස දහසක් ලෝක ධාතුව කම්පා කරවමින් 512000 අධික අසීමත් සර්වඥ සම්බුද්ධරාජෝත්තමයාණන් වහන්සේලා හා පේලිවෙමින් ශ්‍රී සර්වඥතා සම්බුද්ධ ඥාණය ඒකාන්තයෙන් අවබෝධ වේවා. අනන්ත අප්‍රමාණ දෙව් මිනිසුන් සහිත ලෝකයා අමාමහ නිවනින් සැනසීම පිණිසම මේ කුසල ශක්තියෙන් ඒකාන්තයෙන්ම හේතු වේවා !

අති පූජනීය නා උයනේ අරියධම්මාභිධාන මහෝත්තමයාණන් වහන්සේ විංශත් ශතවර්ෂාධික කාලයක් ශ්‍රී සර්වඥතා සම්බුද්ධ ශාසනය ඒකාලෝක කරමින් නිදුක්ව නීරෝගීව වැඩ සිටීම පිණිස මෙම කුසලය ඒකාන්තයෙන් උපනිශ්‍රය වේවා !

සාධු සාධු සාධු !!!

අරියමග්ග සංවිධානය.
2009.06.27

# ධර්මදානය

සමරසේකර පුණ්‍යභාර අරමුදලින් ආතර් සමරසේකර මහතා සහ එම මැතිණිය නන්දසීලී සමරසේර මහත්මිය ධර්ම ග්‍රන්ථ 600 දායකත්වය

රන්ජන් ගාමිණී වල්පොල මහතා ධර්ම ග්‍රන්ථ 500 දායකත්වය

චන්ද්‍රාණි විජේතුංග මහත්මිය ධර්ම ග්‍රන්ථ 500ක දායකත්වය

අනුර ධර්මප්‍රේම මහත්මයා ධර්ම ග්‍රන්ථ 250 දායකත්වය

නාලිනී ජයසූරිය මහත්මිය ධර්ම ග්‍රන්ථ 140 දායකත්වය

එච්. පී. කුසුමලතා මහත්මිය ධර්ම ග්‍රන්ථ 100 දායකත්වය

සුදත් අන්නාසිවත්ත මහතා ධර්ම ග්‍රන්ථ 100 දායකත්වය

ඉහත මහත්ම මහත්මීන්ට අමතරව ලංකාවේ විවිධ ප්‍රදේශයන්හි බැතිමතුන් ද තම තමන්ගේ පුණ්‍ය ප්‍රාර්ථනා අරමුණු කරමින් මෙම උතුම් ධර්ම දානමය පූජාවට දායක විය.

මෙම අටවිසි බුදුරජාණන් වහන්සේලා වන්දනා, තෙරුවන් වන්දනා සහ සෙත් පිරිත් දේශනා ඇතුලත් ධර්ම දානමය කුසලානිසංසය ගන්න හෙලන හුස්ම රැල්ලක් පාසාම අලෝභ අදෝස අමෝහ සිත් පෙරදැරිව සුවසේම පාරමීදම් පුරා අමා මහ නිවනින් සැනසීම පිණිසම ඒකාන්තයෙන් හේතු වේවා.

අරියමග්ග සංවිධානය.
2009.06.27

අරියමග්ග සංවිධානය

දුරකථන: 0714242295, 0715349600, 0715349603

Email: ariyamagga@yahoo.com

Web: www.ariyamagga.org
www.ariyainfo.org